# පොදු නියම හා කොන්දේසි.

## පටුන

නියම ඉදිරිපත් කිරීම.

අර්ථ නිරූපන.

1. සියලු ගිණුම් සඳහා පොදු නියම.
2. බැංකු පාස්පොත් ඉතුරුම් ගිණුම්/ ගිණුම් ප්‍රකාශය/ විද්‍යුත් ප්‍රකාශ ඉතුරුම් ගිණුම්.
3. ජංගම ගිණුම්.
4. වාර තැන්පතු.
5. ළමා ඉතුරුම් ගිණුම්. (බාල වයස්කාර ඉතුරුම්)
6. ඇමතුම් මධ්‍යස්ථාන සේවා සහ ඇමතුම් මධ්‍යස්ථාන සේවා හානිපූරණය.
7. බදු.
8. බදු අනුකූලතාවය.
9. පාලන නීතිය සහ අධිකරණ බලප්‍රදේශය.
10. වෙනත් සාමාන්‍ය වගන්ති.
11. බැංකු සේවා පිරිවැය.
12. දත්ත රඳවා ගැනීම සහ ගබඩා කිරීම.
13. උපදෙස් මත ක්‍රියා කිරීම.
14. උපයෝගීතා බිල්පත් ගෙවීම.
15. මූල්‍ය ගණුදෙනු නියෝග.
16. තොරතුරු හෙලිදරව් කිරීම.
17. ගණුදෙනුකරුවන්ගේ තොරතුරු රැස් කිරීම, සැකසුම් කිරීම සහ හුවමාරු කිරීම.
18. දත්ත ආරක්ෂා කිරීම.
19. මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම්.
20. හිලව් කිරීමේ සහ උකස් කිරීමේ බැංකුවේ අයිතිවාසිකම්.
21. අත්හැර දමන ලද දේපළ.
22. විවිධ විධිවිධාන.
23. ගිවිසුම් අවසන් කිරීමෙන් පසු ඉතිරිවන දේ.
24. නියම සංශෝධනය කිරීම.
25. නියමයන්හි අනුවාදය.
26. පාලනයෙන් පරිබාහිර අදිසි තත්ත්වය.

පහත සඳහන් **නියම හා කොන්දේසි** මගින් **කාගිල්ස් බෑන්ක් ලිමිටඩ්** ආයතනය සමග පවත්වාගෙන යනු ලබන සියලුම ශ්‍රී ලංකා රුපියල්වලින් යුත් සහ විදේශ ව්‍යවහාර මුදලින් යුත් ඉතුරුම් ගිණුම්/ ජංගම ගිණුම්/ වාර තැන්පතු ගිණුම් පාලනය වන්නේය.

**කාගිල්ස් බෑන්ක් ලිමිටඩ්** ආයතනය යනු ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ පවතින බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වේ.

බැංකු කටයුතු පැවැත්වීමේ, ආයෝජන, මූල්‍ය සහ වෙනත් ගණුදෙනු මෙන්ම විවිධ ස්වරූපයේ ගණුදෙනු පැවැත්වීමේ කාර්ය සඳහා සහ **කාගිල්ස් බැංකුවෙන්** සේවා, නිෂ්පාදන, තොරතුරු, භාණ්ඩ, ප්‍රතිලාභ සහ වරප්‍රසාද ලබා ගැනීමේ කාර්ය සඳහා **කාගිල්ස් බැංකුව** වෙත උපදෙස් ලබා ගැනීම සඳහා සහ කාගිල්ස් බැංකුව සමග සන්නිවේදන කටයුතු සිදුකිරීම සඳහා (පද සම්බන්ධයෙන් හෝ යෙදුම අනුව මෙහිදී ගිණුම්හිමියා/ ගිණුම්හිමියන්, ඔහුගේ උරුමක්කරුවන්/ උරුමක්කාරියන්, අද්මිනිස්ත්‍රාසිකරුවන්, පොල්මඃකරුවන් සහ යම් නීත්‍යානුකූල නියෝජිතයන් අවශ්‍යවන හෝ පිළිගනු ලබන, අදහස්වන සහ ඇතුළත්වන මෙහි මින් මතු ''ගිණුම්හිමියා/ ගිණුම්හිමියන්'', ''ඔබ'', ''ඔබගේ'', ''ඔබලාගේ'' යනුවෙන් සඳහන් කරනු ලබන) කාගිල්ස් බැංකුවේ ගිණුම්හිමියාට/ ගිණුම්හිමියන්ට හැකියාව ලැබෙන පරිදි, මෙම නියම සහ කොන්දේසිවලට යටත්ව පද සම්බන්ධය හෝ යෙදුම අනුව මෙයින් මින් මතු ස්වකීය අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්ලාභීන් සඳහා ඉඩ දෙනු ලබන හෝ අවශ්‍යවන හෝ ඇතුළත්වන මෙහි මින් මතු **කාගිල්ස් බැංකුව,** ''බැංකුව'' ''අප'' ''අපි'' ''අපගේ'' යනුවෙන් සඳහන් කරනු ලබන) **කාගිල්ස් බෑන්ක් ලිමිටඩ්** ආයතනය විසින් කලින් කල කාගිල්ස් බැංකුවේ ගිණුම්හිමියා/ගිණුම්හිමියන් වෙත බැංකු සේවා පහසුකම් සහ තොරතුරු සපයනු ලබන්නේය.

(මෙහි මින්මතු අර්ථ නිරූපණය කරනු ලබන) මෙම නියම හා කොන්දේසි මගින්, ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් භාවිත කරනු ලබන හෝ අපගෙන් ඉල්ලා සිටිනු ලබන හෝ අප විසින් ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් වෙත සපයනු ලබන බැංකු සේවා, පහසුකම් සහ තොරතුරුවලට අදාල ගිණුම්හිමියාගේ/ ගිණුම්හිමියන්ගේ වගකීම් සහ බැඳීම් පැහැදිලි කරනු ලබයි.

ඉහත සඳහන් "කාගිල්ස් බැංකුව" සහ ගිණුම්හිමියා/ගිණුම්හිමියන් යන්නෙන් (මෙහි මින්මතු අර්ථ නිරූපණය කරනු ලබන) මෙම ගිවිසුමේ ''පාර්ශවයන්'' මෙහි මින්මතු සාමූහිකව හඳුන්වනු ලබන අතර තනි පුද්ගලයකු සඳහා මෙහි මින්මතු මෙම ගිවිසුමේ ''පාර්ශවය'' ලෙස හඳුන්වනු ලැබේ.

මෙහි අන්තර්ගත සියලුම නියම හා කොන්දේසි මගින් ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් පරම වශයෙන් සහ සමාන ලෙස බැඳී සිටියි. එකී නියම සහ කොන්දේසි බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.cargillsbank.com යන වෙබ් අඩවියේ පවතින අතර එහි පිටපතක් ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසුව බැංකුවේ ශාඛා කාර්යාලයෙන් ලබා ගත හැකිය. මෙය ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් වෙත ලබා දෙන නිවේදනයක් ලෙස සලකනු ලැබිය යුතුය.

**නියම හා කොන්දේසි පිළිගැනීම.**

නියම හෝ කොන්දේසි මා/අප විසින් කියවා සම්පූර්ණයෙන්ම අවබෝධ කරගෙන සිටින බවත් ඒ යටතේවූ බැඳීම්, වගකීම් සහ අයිතිවාසිකම් මා/අප විසින් දැනුවත්ව සිටින බවත් ඉහතකී නියම හා කොන්දේසි මා/අප විසින් පිළිගෙන සිටින බවත් මා/අප විසින් මෙයින් ප්‍රකාශ කර සිටිමි ලැබේ.

………………………………….. …………………………………

**නියමයන් ඉදිරිපත් කිරීම.**

- ඒක වචන යෙදුම් සඳහා බහු වචන යෙදුම් ද (බහු වචන යෙදුම් සඳහා ඒක වචන යෙදුම්ද) ඇතුළත් වේ.

- ''ඔබ'' ''ඔබගේ'' ''ඔහුට'' හෝ එයට සමාන සර්ව නාම මගින් පද සම්බන්ධය අනුව පිළිගනු ලබන ආකාරයට අදාළවන පරිදි ගිණුම්හිමියා අදහස්වේ. පුරුෂලිංග සියලු සඳහන් කිරීම් සඳහා ස්ත්‍රීලිංග සඳහන් කිරීම්ද ඇතුළත් වේ.

- මෙහි සඳහන් නියම හා කොන්දේසි මගින් සියලු පොදු අදාලවීම්වලට අතිරේකව ඉතුරුම්, ජංගම සහ වාර තැන්පතු ආවරණය වේ.

- මෙහි ආවරණයවී නොමැති විශේෂිත නිෂ්පාදන සහ සේවාවලට අදාළ නියම හා කොන්දේසි ඉල්ලීමක් කිරීමේදී බැංකු ශාඛාවලින් ලබා ගත හැකිය.

**අර්ථනිරූපන.**

පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍යවේනම් මිස, මෙම නියම සහ කොන්දේසිවල භාවිතා කරනු ලබන පහත තද අකුරින් සඳහන් යෙදුම් සඳහා පහත සඳහන් අර්ථයන් ඇත්තේය.

- **ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් (තවද ''ඔබ'', ''ඔබගේ'', ''ඔබලාගේ'')** යන්නෙන් **කාගීල්ස් බැංකුව** සමග විවෘතකර පවත්වාගෙන යනු ලබන මූලික ගිණුමට අදාළ ගිණුම් විවෘත කිරීමේ ඉල්ලුම්පත්‍රයේ නම් සඳහන් ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් අදහස් වේ.

- **"ගිවිසුම"** යන්නෙන් මෙම ගිවිසුමේ කොටසක් සංයුක්තවන්නාවූද කලින් කළ ප්‍රසිද්ධ කරනු ලබන්නාවූ සේවාවන් සැපයීම සඳහාවූ උපකාරක නියම හා කොන්දේසිද ඇතුළුව මෙහි මින් මතු සඳහන් කරනු ලබන සහ මෙම ගිවිසුමේ නියමයන් ප්‍රකාරව කලින් කල වෙනස් කරනු ලැබිය හැකි නියම හා කොන්දේසි සමූහය අදහස් වේ.

- **“ATM”** යන්නෙන් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර අදහස් වේ. මෙම නියම හා කොන්දේසිවල “ATM” යන යෙදුම සඳහා කාඩ්පත භාවිතා කිරීම හරහා ක්‍රියාත්මකවන ජාලයක කොටසක් සංයුක්තවන (කාඩ්පත නිකුත් කර ඇති රට ඇතුළත හෝ එම රටින් පිටත පවතින) යම් සමාන යන්ත්‍රයක් ඇතුළත් වේ.

- **''අධිකාරීන්”** යන්නෙන් යම් අධිකරණ, පරිපාලන හෝ නියාමන ආයතනයක්, යම් රජයක් හෝ පොදු හෝ රාජ්‍ය නියෝජිත ආයතනයක්, උපකාරක ආයතනයක් හෝ අධිකාරියක්, යම් බදු අධිකාරියක්, සුරකුම්පත් හෝ අනාගත හුවමාරුවක්, අධිකරණයක්, මහ බැංකුවක් හෝ **කාගිල්ස් බැංකුවේ** යම් කොටසක් කෙරෙහි අධිකරණ බලයක් සහිත නීතිය බලාත්මක කිරීමේ ආයතනයක් හෝ එහි යම් නියෝජිතයන් අදහස් වේ.

- **''බැංකු දිනය/ සාමාන්‍ය බැංකු රාජකාරි වේලාවන් සහ වැඩ කරන දිනය/ වැඩ කරන කාලය”** යන්නෙන් අප විසින් අන්‍යාකාරයකින් නිශ්චිතව දක්වා ඇත්නම් මිස, බැංකු දිනයක්/ බැංකු වැඩ කරන දිනයක් සහ සාමාන්‍ය බැංකු/ වැඩ කිරීමේ කාලයත් අදහස් වේ.

- **''කාගිල්ස් බෑන්ක් ලිමිටඩ්”** යන්නෙන් ස්වකීය ලියාපදිංචි කාර්යාලය අංක 696, ගාලුපාර, කොළඹ 03 දරණ ස්ථානයේ පිහිටා ඇති ශ්‍රී ලංකාව ඇතුළත ස්වකීය ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යනු ලබන ශ්‍රීලංකා මහ බැංකුවේ අධිකරණ බල ප්‍රදේශය යටතේ යථාපරිදි සංස්ථාගතකර ඇති බැංකුවක් අදහස් වේ.

- **''අනුකූලව ක්‍රියා කිරීමේ බැඳීම්”** යන්නෙන් (අ) යම් අදාල දේශීය හෝ විදේශීය ප්‍රඥප්තියක්, නීතියක්, නියෝගයක්, ආඥාපනතක්, රීතියක්, නඩුතීන්දුවක්, තීන්දු ප්‍රකාශයක්, ස්වේච්ඡා සංග්‍රහයක්, විධානයක්, සම්බාධක ක්‍රමයක්, අධිකරණ නියෝගයක් **කාගිල්ස් බැංකුවේ** යම් සාමාජිකයකු සහ අධිකාරියක් සමගවූ ගිවිසුමක් හෝ අධිකාරීන් අතර පවතින සහ **කාගිල්ස් බැංකුවට** (“නීති”) අදාලවන යම් ගිවිසුමක් හෝ සම්මුතියක් හෝ ජාත්‍යන්තර මාර්ගෝපදේශයක් සහ අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි සමග; (ආ) යම් අධිකාරීන්ගෙන් ලැබෙන (වලංගු) ඉල්ලීමක්, හෝ වාර්තා කිරීමක්, නියාමන වෙළඳ වාර්තා කිරීමක්, හෙළිදරව් කිරීමක් හෝ නීතිය යටතේවූ වෙනත් යම් බැඳීම් සමග; සහ (ඇ) අපගේ ගණුදෙනුකරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කරගැනීම සඳහා **කාගිල්ස් බැංකුවට** අවශ්‍ය වෙන යම් නීති සමග අනුකූලව ක්‍රියා කිරීම සඳහාවූ **කාගිල්ස් බැංකුවේ** යම් සාමාජිකයකුගේ බැඳීම් අදහස් වේ.

- **"රහසා තොරතුරු"** යන්නෙන් පොදු නොවන හෝ හිමිකාරත්ව ස්වභාවයෙන් යුක්ත හෙළිදරව් කරනු ලබන අවස්ථාවේදී රහසා බවට ගණුදෙනුකරු විසින් නම් කරනු ලබන හෝ යම් සාධාරණ තැනැත්තකු විසින් රහසා බවට සලකනු ලබන යම් තොරතුරක් අදහස් වේ.

- **''සම්බන්ධිත තැනැත්තා"** යන්නෙන් සේවා සැපයීම සම්බන්ධයෙන් ස්වකීය තොරතුරු (පුද්ගලික තොරතුරු හෝ බදු තොරතුරු ඇතුළුව) ගණුදෙනුකරු විසින් හෝ වෙනුවෙන් **කාගිල්ස් බැංකුවේ** යම් සාමාජිකයකු වෙත සපයනු ලබන්නාවූ හෝ **කාගිල්ස් බැංකුව** විසින් අනායාකාරයකින් ලබා ගැනීමට කටයුතු සලස්වනු ලබන යම් තැනැත්තකු හෝ ආස්ථිත්වයක් අදහස් වේ. ගණුදෙනුකරු සම්බන්ධයෙන් ගත්කල, සම්බන්ධිත තැනැත්තකු යන්නට (ගණුදෙනුකරුගේ) යම් ඇපකරුවකු, සමාගමක අධායක්ෂවරයකු හෝ නිලධරයකු, හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් හෝ සාමාජිකයන්, යම් වැදගත් අයිතිකරුවකු, පාලනය කිරීමේ තැනැත්තකු හෝ යම් භාරයක අර්ථලාභී අයිතිකරුවකු, භාරකරුවකු, බේරුම්කරුවකු හෝ ආරක්ෂකයකු, නම්කල ගිණුමක ගිණුම්හිමියකු, නම් කළ ගෙවීමක ගෙවීම් ග්‍රාහකයකු, ගණුදෙනුකරුගේ නියෝජිතයකු, අනුයෝජිතයකු හෝ නාමිකයකු හෝ **කාගිල්ස් බැංකුව** සමග පවතින ස්වකීය බැංකු සම්බන්ධතාවයට අදාළව සම්බන්ධතාවක් පවතින වෙනත් යම් තැනැත්තන් හෝ ආස්ථිත්ව යනාදී ඊට සීමා නොවන්නාවූ ඉහතකී සියල්ල ඇතුළත් වේ.

- **''පාලනය කිරීමේ තැනැත්තන්''** යන්නෙන් (පොදුවේ) යම් ආස්ථිත්වයක පාලනය ක්‍රියාත්මක කරනු ලබන තනි පුද්ගලයන් අදහස් වන අතර (භාරයක් සම්බන්ධයෙන් ගත් කල, මෙම තැනැත්තන් සඳහා බේරුම්කරුවකු, භාරකරුවන්, ආරක්ෂාකරුවන්, අර්ථලාභීන් හෝ අර්ථලාභීන්ගේ පන්තියක් සහ භාරය සම්බන්ධ අවසාන බලාත්මක පාලනයක් ක්‍රියාත්මක කරනු ලබන වෙනත් තනි පුද්ගලයකු අදහස්වන අතර භාරයක් හැර යම් නෛතික අස්ථිත්වයක් සම්බන්ධයෙන් වන විට, එම යෙදුම මගින් පාලනයේ සමාන හෝ ඉතා සමාන තත්ත්වයක් දරන තැනැත්තන් අදහස් වේ.)

- **''ගණුදෙනුකාර තොරතුරු''** යන්නෙන් (ඒ සමග පවතින ප්‍රකාශ, අත්හැරීම් සහ කැමැත්ත ලබාදීම් ඇතුළුව) ගණුදෙනුකරුගේ හෝ සම්බන්ධිත තැනැත්තකුගේ පුද්ගලික තොරතුරු, රහසා තොරතුරු සහ/හෝ බදු තොරතුරු අදහස් වේ.

- **''මූලා අපරාධය''** යන්නෙන් මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම, අල්ලස, දූෂණය, බදු පැහැර හැරීම්, වංචා, ආර්ථික හෝ වෙළෙඳ සම්බාධක පැහැර

හැරීම සහ/ හෝ මෙම කරුණුවලට අදාළ යම් නීති, නියෝග උල්ලංඝනය කිරීම හෝ මඟ හැරීමට හෝ උල්ලංඝනය කිරීමට උත්සාහ කිරීම අදහස් වේ.

- **''තොරතුරු''** යන්නෙන් අප විසින් හෝ තොරතුරු සපයන්නකු විසින් සපයනු ලබන සහ ගිණුම්හිමියාගේ/ ගිණුම්හිමියන්ගේ ප්‍රයෝජනය සඳහා ලබාදෙන යම් මූල්‍යමය, වෙළඳපල හෝ වෙනත් තොරතුරු සහ දත්ත අදහස් වේ.

- **''තොරතුරු සපයන්නා''** යන්නෙන් තොරතුරු සපයනු ලබන **''කාගිල්ස් බැංකුව''** හැර වෙනත් යම් තැනැත්තකු අදහස්වන අතර එයට යම් තොරතුරු සපයන්නකු වෙත තොරතුරු සපයනු ලබන තැනැත්තකු ඇතුළුව ඊට සීමා නොවන්නාවූ යම් තැනැත්තන් ඇතුළත් වේ.

- **''ආයතනය''** යන්නෙන් මෙම ගිවිසුමේ කාර්යය සඳහා ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු **කාගිල්ස් බැංකුව** වෙත ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් දැනුම්දී ඇති යම් තුන්වන පාර්ශව මූල්‍ය ආයතනයක් අදහස් වේ.

- **''උපදෙස්''** යන්නෙන් ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් **කාගිල්ස් බැංකුව** වෙත යොමු කරනු ලබන සහ **කාගිල්ස් බැංකුව** විසින් ලබාගන්නා ලද යථා පරිදි බලය පවරන ලද යම් ලිඛිත ඉල්ලීමක් හෝ වෙනත් යම් බලයලත් ස්වයංක්‍රීය උපදෙසක් අදහස් වේ.

- **''පාඩුව''** යන්නෙන් ඕනෑම ආකාරයකින් ගණනය කරනු ලබන හෝ සිදුවන සෘජු හෝ වක්‍ර, අනියම් දණ්ඩනීය හෝ අනුෂංගික වන්නාවූ (යම් නෛතික හෝ වෙනත් වෘත්තීය ගාස්තුවක් ඇතුළුව ඊට සීමානොවන්නාවූ) යම් හිමිකම්පෑමක්, ගාස්තුවක්, පිරිවැයක්, අලාභ, ණය, වියදම්, බදු, වගකීම්, බැඳීම්, චෝදනා, සිවිල් නඩු, අපරාධ නඩු, ඉල්ලීම්, නඩු නිමිති, නඩු කටයුතු හෝ නඩු තීන්දුවක් අදහස් වේ.

- **''මෙහෙයුම් උපදෙස්''** යන්නෙන් තැනැත්තන් දෙදෙනකු හෝ වැඩි දෙනකු ඒකාබද්ධවී ඇති හවුල් ගිණුම් සම්බන්ධයෙන් ගත් කළ ගිණුම මෙහෙයවනු ලබන ආකාරය සහ ගිණුම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා බැංකුව වෙත නියමවන ආකාරය අදහස් වේ.

- **''මුර වචනය''** යන්නෙන් ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් වෙත බැංකුව විසින් නිකුත් කරනු ලබන ක්‍රෙඩිට් කාඩ්පත් ඇතුළුව ඊට සීමා නොවන්නාවූ පරිදි ඩෙබිට් කාඩ්පත් භාවිතා කිරීම මගින් දුරකථන බැංකු සේවය හරහා, අන්තර්ජාල බැංකු සේවය හරහා සහ ජංගම

බැංකු සේවය හරහා ගණුදෙනු වෙත ප්‍රවේශවීම හෝ ගණුදෙනු සිදුකිරීමේ හෝ ගණුදෙනු බලාත්මක කිරීමේ කාර්යය සඳහා සකස් කරනු ලබන අක්ෂර සහ ඉලක්කම් දෙවර්ගයම අන්තර්ගතවන යම් රහස්‍ය වචනයක්, වාක්‍ය කොටසක් හෝ අංකයක් අදහස් වේ.

- **''පුද්ගලික දත්ත''** යන්නෙන් සංවේදී පුද්ගලික දත්ත, නම (නම්), පදිංචි ලිපිනය (ලිපිනයන්), සම්බන්ධතා අංක විස්තර, වයස, උපන් දිනය, උපන් ස්ථානය, ජාතිකත්වය, පුරවැසිභාවය, පුද්ගලික තත්ත්වය සහ විවාහ අවිවාහක බව ඇතුළුව එම දත්තවලට සීමා නොවන්නාවූ යම් තනි පුද්ගලයකු හඳුනාගනු ලැබිය හැකි යම් තනි පුද්ගලයකුට අදාල දත්ත (සහ ආයතන සඳහා දත්ත පුද්ගලිකත්ව නීතිය අදාළවන රටවල පවතින සංස්ථා අස්ථිත්ව සඳහා අදාලවන දත්ත) අදහස් වේ.

- **''සේවාවන්''** යන්නෙන් (අ) ගණුදෙනුකරුගේ බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යෑම සහ එම ගිණුම වසා දැමීම; (ආ) (උදාහරණ වශයෙන් සුරැකුම්පත් ගණුදෙනු, ආයෝජන උපදේශන, තැරැව්කාර, නියෝජිත, භාරකාරත්ව, නිශ්කාශන හෝ තාක්ෂණ සැපයීම් සේවා ඇතුළු) ගණුදෙනුකරු වෙත ණය පහසුකම් සහ වෙනත් බැංකු නිෂ්පාදන සහ සේවා සැපයීම, ඉල්ලුම්පත්‍ර සැකසුම් කිරීම, උපකාරක ණය තක්සේරු කිරීම සහ නිෂ්පාදන යෝග්‍යතාවය තක්සේරු කිරීම; සහ (ඇ) ගණුදෙනුකරු වෙත අලෙවි කරන හෝ ප්‍රවර්ධන මූල්‍ය සේවා හෝ ආශ්‍රිත නිෂ්පාදන සේවා සැපයීම, වෙළඳපල පර්යේෂණ, රක්ෂණය, විගණන සහ පරිපාලන අරමුණු ලබා දීම ඇතුළුව ගණුදෙනුකරු සමග **කාගිල්ස් බැංකුවේ** සමස්ත සම්බන්ධතාවය පවත්වාගෙන යෑම වැනි ඊට සීමා නො වන්නාවූ සේවාවන් අදහස් වේ.

- **''ප්‍රකාශනය''** යන්නෙන් යම් දෙන ලද කාලසීමාවක් තුළදී සිදු කරන ලද සියළුම ගණුදෙනු සහ එම ගිණුමේ පවතින ශේෂය නිශ්චිතව දක්වමින් **කාගිල්ස් බැංකුව** විසින් යම් ගිණුම්හිමියකු/ ගිණුම්හිමියන් වෙත යවන ලද ගිණුමේ/ ගිණුම්වල කාලීන ගිණුම් ප්‍රකාශයක් අදහස් වේ. ඒ සඳහා **කාගිල්ස් බැංකුව** විසින් ඇතුලත් කිරීම සුදුසු බවට අදහස් කරනු ලබන වෙනත් යම් තොරතුරුද ඇතුළත් කරනු ලැබිය හැකිය.

- **''සැලකිය යුතු අයිතිකරුවන්''** යන්නෙන් යම් අස්ථිත්වයක සෘජුව හෝ වක්‍රව ලාභයෙන් 10%කට වැඩි ප්‍රමාණයක් සඳහා හිමිකම් දරනු ලබන හෝ 10% වැඩි ප්‍රමාණයක සම්බන්ධතාවයක් සහිත තනි පුද්ගලයන් අදහස් වේ.

- **''බදු අධිකාරීන්''** යන්නෙන් දේශීය හෝ විදේශීය බදු, ආදායම්, මූල්‍ය හෝ මුදල් අධිකාරීන් අදහස් වේ.

- **''බදු තොරතුරු''** යන්නෙන් (යම් ගණුදෙනුකරුවකු තනි පුද්ගලයකු හෝ ව්‍යාපාරයක් වුවද නැතහොත්, ලාභ නොලබන හෝ වෙනත් සංස්ථා අස්ථිත්වයක් වුවද ඒ පිළිබඳ නොසලකා හරිමින්) යම් ගණුදෙනුකරුවකුගේ බදු තත්ත්වයට සෘජුව හෝ වක්‍රව සම්බන්ධවන යම් ලේඛනයක් හෝ තොරතුරක් (සහ ඒ සමග පවතින ප්‍රකාශයන්, අත්හැරීම් සහ කැමැත්ත ලබා දීම්) අදහස්වන අතර සාධාරණ ලෙස ක්‍රියා කරමින් සිටින බවට **කාගිල්ස් බැංකුව** විසින් සලකනු ලබන යම් ගණුදෙනුකරුවකුගේ අයිතිකරුවකු, ''පාලනය කරනු ලබන තැනැත්තකු'', ''සැලකිය යුතු අයිතිකරුවකු'' හෝ අර්ථලාභී අයිතිකරුවකු විසින් බදු අධිකාරිය සමඟ එකඟව ක්‍රියා කිරීම (හෝ අනුකූලව ක්‍රියා කිරීම ප්‍රදර්ශනය කිරීම හෝ අනුකූලව ක්‍රියා නොකිරීම වැළැක්වීම) අවශ්‍ය වන්නේය. **''බදු තොරතුරු''** සඳහා බදු අය කිරීමේ ස්ථානය සහ/ හෝ සංවිධානය පිහිටි ස්ථානය (අදාළ වන පරිදි) පිළිබඳ තොරතුරු, නිත්‍ය බදු ස්ථානය, බදු හඳුනාගැනීමේ අංකය පිළිබඳ තොරතුරු, බදු සහතික ආකෘතිපත්‍ර, ඇතැම් පුද්ගලික දත්ත පිළිබඳ [නම (නම්), පදිංචි ලිපිනය (ලිපිනයන්), වයස, උපන් දිනය, උපන් ස්ථානය, ජාතිකත්වය, පුරවැසිභාවය ඇතුළු] තොරතුරු ඇතුළු ඊට සීමා නොවන්නාවූ තොරතුරු ඇතුළත් වේ.

- **''බදු සහතික ආකෘති පත්‍ර''** යන්නෙන් යම් ගිණුම්හිමියකුගේ හෝ අස්ථිත්වයක යම් සම්බන්ධිත තැනැත්තකුගේ බදු තත්ත්වය තහවුරු කිරීම සඳහා බදු අධිකාරිය විසින් හෝ **කාගිල්ස් බැංකුව** විසින් කලින් කල නිකුත් කරනු ලබන හෝ නියම කරනු ලබන යම් ආකෘතිපත්‍ර හෝ වෙනත් යම් ලේඛන අදහස් වේ.

- **''නියම''** යන්නෙන් අප විසින් ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් වෙත දැනුම් දෙනු ලබන කලින් කල සංශෝධනය කරනු ලැබිය හැකි උපකාරක නියමයන් ඇතුළු ඊට සීමා නොවන්නාවූ නියම ඇතුළුව මෙම ගිවිසුම පාලනය කරනු ලබන නියම හා කොන්දේසි, යම් හිමිකම් අත්හැරීම්, අන්තර්ජාල පුද්ගලිකත්ව ප්‍රකාශයක්/ ප්‍රකාශ සහ මාර්ගෝපදේශ අදහස් වේ.

- **''ගණුදෙනුව/ ගණුදෙනු''** යන්නෙන් ගිණුම් සම්බන්ධයෙන් අවසරලත් ක්‍රියාකාරකම් බලාත්මක කිරීම සඳහා **කාගිල්ස් බැංකුව** වෙත ගිණුම්හිමියා විසින් ලිඛිතව හෝ KIOSK භාවිතයෙන්, ඩෙබිට් කාඩ් පත/ ක්‍රෙඩිට් කාඩ්පත භාවිතයෙන් හෝ අන්තර්ජාල/ ජංගම බැංකු සේවය භාවිතයෙන් හෝ අනාගතයේදී හඳුන්වා දෙනු ලැබිය හැකි වෙනත්

මාධ්‍යයන් හරහා ලබා දෙන යම් අවසරලත් උපදෙසක් අදහස් වේ. (ගණුදෙනු පිළිබඳ උදාහරණ සඳහා මුදල් ආපසු ගැනීම්, විකුණුම් ස්ථානයේ ගෙවීම්, මුදල්/ චෙක්පත් තැන්පතු, අරමුදල් පැවරීම් යනාදිය ඇතුළත් වේ.)

# 1. සියලු ගිණුම් සඳහා පොදු කරුණු.

## 1.1 ඇතුළත්වීම සඳහාවූ නිර්ණායක.

1.1.1. බැංකුව විසින් පිළිගත හැකි හඳුනාගැනීමේ ලේඛනයක්/ ලේඛන ඉදිරිපත් කිරීම මගින් පුද්ගල හඳුනාගැනීමක් මත [උදා:- ජාතික හැඳුනුම්පත (NIC), විදේශ ගමන් බලපත්‍රය සහ ජාතික හැඳුනුම්පත් අංකය දරනු ලබන රියදුරු බලපත්‍රය] සහ ලබාදුන් පදිංචි ලිපිනය තහවුරු කරගැනීම සඳහාවූ තහවුරු කිරීමේ ලේඛන මත යම් තැනැත්තකු/ තැනැත්තන් විසින් රුපියල් ඉතුරුම් ගිණුමක්, ජංගම ගිණුමක් සහ කාලීන තැන්පතු ගිණුමක් විවෘත කරනු ලැබිය හැකිය.

1.1.2. 1.1.2.1 තමාගේම නමින් යම් තනි පුද්ගලයෙකු විසින්;

1.1.2.2 මෙහෙයුම් උපදෙස් සමග සපයා ඇති ස්වකීය නම්වලින් තැනැත්තන් දෙදෙනකු හෝ වැඩි දෙනකු විසින් ඒකාබද්ධව;

[මෙහි මින් මතු පරම වශයෙන් ''ගිණුම'' යනුවෙන් හෝ හවුල් වශයෙන් ''ගිණුම්'' යනුවෙන් සඳහන් කරනු ලබන] රුපියල් ඉතුරුම් ගිණුමක් (ගිණුම්), ජංගම ගිණුමක් (ගිණුම්) සහ වාර තැන්පතුවක් (වාර තැන්පතු) විවෘත කරනු ලැබිය හැකිය.

1.1.3 සෑම ගිණුමක් සඳහාම ''ගිණුම් අංකය'' යනුවෙන් හඳුන්වනු ලබන අංකයක් ලබා දෙන අතර එම අංකය බැංකුව සමග පවත්වනු ලබන සියලු සන්නිවේදන කටයුතුවලදී සහ (තැන්පතු, පැවරීම්, විමසීම්, ගෙවීම් පත්‍රිකා සහ මුදල් ආපසු ගැනීමේ ආකෘති පත්‍ර වැනි) සියලුම මූල්‍යමය සහ මූල්‍යමය නොවන ගණුදෙනුවලදී සඳහන් කරනු ලැබිය යුතුය.

1.1.4 සෑම ගිණුමක් සඳහාම අවම ශේෂයක් පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාවක් පවතින අතර එම ශේෂය බැංකුවේ අභිමතය පරිදි කලින් කල වෙනස්වීමට යටත් වන්නේය. ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් එම අවම ශේෂය සපුරාලනු නොලබයි නම්, එවැනි ගිණුම් මත බැංකුව විසින් ගණුදෙනු කිරීමේ ගාස්තු සහ/ හෝ සේවා ගාස්තු පනවනු ලැබිය හැකිය. වර්තමාන බදු අයකිරීම් අදාළ වේ.

1.1.5 ගිණුම්හිමියා සංයුක්තවන යම් තනි පුද්ගලයකුගේ මරණය සිදු වී ඇති අවස්ථාවකදී, එකී හවුල් ගිණුමේ බැරට පවතින මුදල් ජීවත්ව සිටින ගිණුම්හිමියා වෙත හෝ ගිණුම්හිමියන් වෙත ගෙවනු ලබන අතර මෙහෙයුම් උපදෙස් ප්‍රකාරව මුදල් ගෙවීම සම්බන්ධයෙන් කිසිදු හවුල් ගිණුම්හිමියකු වෙත බැංකුව විසින් වගකීම දරනු නොලැබේ.

හවුල් ගිණුම්හිමියන්ගෙන් යම් තැනැත්තකු හෝ ඕනෑම හවුල් ගිණුම්හිමියකු මියයෑම පිළිබඳව බැංකුව වෙත නිවේදනය වීමෙන් පසුව, එම ගිණුම්හිමියාගේ හෝ ගිණුම්හිමියන්ගේ බැරට පවතින හෝ බැංකුව විසින් දරනු ලබන ඕනෑම ආකාරයක සියලුම මුදල්, සුරකුම්පත්, ඔප්පු, ලිපි ලේඛන, සහ වෙනත් දේපළ හවුල් ගිණුම්හිමියාගේ (හවුල් ගිණුම්හිමියන්ගේ) ජීවත්ව සිටින තැනැත්තා හෝ තැනැත්තන් වෙත ගෙවීම හෝ භාරදීමෙන් පසුව හෝ ඔවුන්ගේ නියමය පරිදි එසේ ගෙවීම හෝ භාරදීමෙන් පසුව බැංකුව විසින් ස්වකීය බැඳීම් හවුල් ගිණුම්හිමියා (හවුල් ගිණුම්හිමියන්) වෙත සම්පූර්ණයෙන්ම මුදා හරිනු ලැබිය යුතු බවට එක් එක් හවුල් ගිණුම්හිමියා විසින් එකඟව සිටින බවට මෙහෙයුම් උපදෙස්වල නිශ්චිතව දක්වනු ලැබිය යුතුය. අන්‍යාකාරයකින් ගිණුම මත දරන ලද යම් අයිරාවක් හෝ වෙනත් බැඳීම් එක් එක් හවුල් ගිණුම්හිමියාගේ ඒකාබද්ධ සහ වෙන් වෙන්ව පවතින වගකීම් වන්නේය. යම් නිශ්චිත ගිණුමකට අදාළව එක් හවුල් ගිණුම්හිමියකු හෝ හවුල් ගිණුම්හිමියන් වැඩි දෙනකු විසින් (එහෙත් සියලුම හවුල් ගිණුම්හිමියන් නොවන) මේ යටතේවූ ගිණුම්හිමියන්ගේ අධිකාරී බලය වෙනස් කරනු ලබන හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන අවස්ථාවකදී, එකී ගිණුම ඉන් පසුව සියලුම හවුල් ගිණුම්හිමියන් විසින් ඒකාබද්ධව මෙහෙයවනු ලැබිය යුතු බවට බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි නියම කරනු ලැබිය හැකිය.

1.1.6 යම් වගකීම් අවිනිශ්චිත, ප්‍රාථමික හෝ සම්පාර්ශවීය වුවද සහ එම වගකීම් වෙන් වෙන් වශයෙන් හෝ ඒකාබද්ධව පැවතියද, බැංකුව විසින් දැනුම් දීමකින් තොරව, බැංකුව වෙත පවතින යම් වගකීම් සමග යම් ගිණුමක්/ ගිණුම් සංයුක්ත කිරීම

හෝ ඒකාබද්ධ කිරීම සහ එවැනි ගිණුම්වල බැරට පවතින යම් මුදලක්/ මුදල් හෝ වෙනත් යම් ගිණුම් හෝ වෙනත් යම් කාරණයක් මත බැංකුවෙන් ඔබ වෙත ලැබිය යුතු යම් මුදලක්/ මුදල් හිලව් කිරීම හෝ පැවරීම කරනු ලැබිය හැකිය.

1.1.7 බැංකුව සමඟ පවතින යම් ගිණුමකින් මුදල් හර කිරීම සඳහා බැංකුව වෙත ලබා දෙන යම් විධානයකට අනුව බලය පැවරීමක් සහිතව ගිණුම්හිමියාගේ/ ගිණුම්හිමියන්ගෙන් ලැබෙන (ස්ථාවර උපදෙස් ඇතුළුව) තහවුරු කරන ලද ලිඛිත උපදෙස් මත පමණක් බැංකුව ක්‍රියා කරනු ලැබිය යුතුය.

1.1.8 බැංකුව විසින් ස්වකීය අභිමතය පරිදි සහ හානිපූර්ණයක් ලබාගැනීමට යටත්ව පිරිනමනු ලැබිය හැකි පරිදි බැංකුව සහ ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් අතර පවතින නිශ්චිත ගිවිසුමකින් තොරව, ෆැක්ස්මිලි හරහා හෝ විද්‍යුත් තැපැල හරහා හෝ වෙනත් යම් විද්‍යුත් මාධ්‍යයක් හරහා ලැබෙන උපදෙස් මත බැංකුව විසින් ක්‍රියා නොකරනු ඇත.

## 1.2 තැන්පතු.

1.2.1 මුදල් තැන්පත් කිරීම කැමති වාර ගණනක් සිදු කළ හැකිය. ටෙලර් කවුන්ටරයේදී සිදුකරනු ලබන සියලුම තැන්පතු එම තැන්පතු පත්‍රිකාව වලංගුකිරීම මඟින් හෝ තැන්පතු පත්‍රිකාවමත බැංකුවේ බලයලත් නිලධරයකු විසින් තබනු ලබන අත්සන යටතේ කායික වශයෙන් භාර ගනු ලැබිය හැකිය.

1.2.2 ගිණුම් වෙත තැන්පත් කරනු ලබන චෙක්පත් භාර ගැනීමේ කාර්යය සඳහා පමණක් පිළිගනු ලබයි. ගෙවීම් සිදු කරනු ලබන බැංකුව විසින් නිෂ්කාශනය කරනු ලබන තෙක් ආපසු ලබා ගැනීම සඳහා මුදල් නොපවතිනු ඇත. මෙම නියම හා කොන්දේසිවල කුමක් සඳහන් වුවද, එය නොසලකා හරිමින්, බැංකුව වෙත නිසි උපදෙස් ලැබී ඇත්නම් මිස, චෙක්පත් භාර ගැනීම සහ චෙක්පත් නිෂ්කාශනය කිරීම ඉතිරිකිරීමේ ගිණුම් මගින් අපේක්ෂා කරනු නොලබන අතර ඒ අනුව, රැගෙන එන්නා, තැන්පත්කරු හෝ තුන්වන පාර්ශව වෙත ගෙවීම සඳහා ලියා ඇති චෙක්පත්, ලාභාංශ, මුදල් වවුචර් සහ වෙනත් සාධනපත්‍ර තැන්පත් කිරීම සඳහා භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව විසින් තබාගනු ලැබේ.

1.2.3 ඔබට මුදල් නොවන තැන්පතු සඳහා සම්පූර්ණ නෛතික හිමිකමක් පවතින බවට

සහ එවැනි මුදල් නොවන තැන්පතු මත පවතින අත්සන්වල, පිටසන්වල සහ විස්තරවල සත්‍යභාවය, වලංගුභාවය සහ නිවැරදිභාවය සම්බන්ධ සම්පූර්ණ වගකීම ඔබ විසින් භාර ගනු ලබන බවට ඔබ විසින් නියෝජනයකර සහතිකකර සිටිනු ලැබේ.

1.2.4 නිෂ්කාශනය සඳහා/ භාර ගැනීම සඳහා තැන්පත් කරන ලද වෙනත් බැංකු මත ලියා ඇති රුපියල් චෙක්පත් කලින් කල සංශෝධනය කරනු ලැබිය හැකි ලංකා ක්ලියර් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ රීති සහ නියෝගවලට යටත් වන්නේය. බැංකුවේ පරම අභිමතය පරිදි යම් අයභාරයක් සහිතව හෝ අය භාරයක් රහිතව චෙක්පත් ලිවීමේ බැංකුව විසින් අයකරනු ලබන යම් කොමිස් මුදල් හෝ ගාස්තු පිළිවෙලින්වූ ගිණුම වෙත හෝ වෙනත් යම් ගිණුමක් වෙත හර කරුණු ලැබේ.

1.2.5 බැංකුව වෙත ලියන ලද අණකර/ චෙක්පත් බැංකුවේ යම් ගිණුමක් වෙත බැර කරනු ලබන අවස්ථාවකදී, ස්වකීය ප්‍රසිද්ධ කරන ලද අය බදු ප්‍රකාරව බැංකුව විසින් පාලන ගාස්තු අඩු කරනු ලැබේ.

### 1.2.6 බැංකුව විසින් සටහන් ප්‍රතිවර්තනය කිරීම සහ නිවැරදි කිරීම.

වැරදීමකින් හෝ යම් ක්‍රියාවක් හෝ මග හැරීමක් මගින් බැංකුව විසින් වැරදි සහගත ලෙස ගිණුම්හිමියාගේ/ ගිණුම්හිමියන්ගේ ගිණුමට මුදල් බැර කර ඇති අවස්ථාවකදී, ඕනෑම අදියරකදී සහ/ හෝ ඕනෑම අවස්ථාවකදී එම ඇතුලත් කිරීම සහ (අදාළ වේ නම්) පොලිය ප්‍රතිවර්තනය කිරීම සඳහා සහ/ හෝ ගිණුම්හිමියාගෙන්/ ගිණුම්හිමියන්ගෙන් එම මුදල් ඉල්ලා සිටීම සඳහා බැංකුවට හිමිකමක් ඇත්තේය.

### 1.2.7 විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු සහ විදේශ ව්‍යවහාර මුදල් ප්‍රේෂණ.

#### 1.2.7.1 විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්.

ගණුදෙනුකරුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් මගින් ගණුදෙනුකරුගේ විදේශ ව්‍යවහාර මුදලින් පවතින ගෙවීම් සහ බැහැර කිරීම් විද්‍යුත් ලෙස ගෙවා නිරාකරණය කිරීම සිදුකරනු ලබයි.

#### 1.2.7.2 ප්‍රේෂණ.

(අ) ඉල්ලුම්කරුගේ සම්පූර්ණ අවදානම් දැරීම යටතේ භාහිර ප්‍රේෂණය යැවීම සඳහා බැංකුවට නිදහසක් ඇත්තේය. පණිවුඩය සම්ප්‍රේෂණය කිරීමේදී හෝ පණිවිඩය ලබා ගැනීමේදී සිදුවන එහි වැරදි නියෝජනයන් මගින් හෝ ගෙවීම් කරනු ලැබිය යුතු රටෙහි නිශ්කාෂණ පද්ධතියේ සිදුවන යම් ප්‍රමාදයක් හේතුවෙන් හෝ ප්‍රේෂණ එකතු කිරීමේදී අර්ථලාභී බැංකුවේ යම් පැහැර හැරීමක් හෝ අතපසුවීමක් හේතුවෙන් හෝ බැංකුවේ හෝ එහි නියෝජිතයන්ගේ පාලනයෙන් පරිභාහිරව පවතින යම් හේතුවක් නිසා හෝ යම් වාර්තාකරුවන්ගේ, නියෝජිතයන්ගේ හෝ උපනියෝජිතයන්ගේ ක්‍රියාවක්, මගහැරීමක්, අතපසුකිරීමක්, පැහැරහැරීමක් අපොහොසත්වීමක් හෝ බංකොළොත්භාවය හේතුවෙන් සිදුවිය හැකි ලාභ අහිමිවීම්, හෝ කොන්ත්‍රාත් අහිමිවීම් හෝ පිරිවැය, වියදම් හෝ විශේෂ වක්‍ර හෝ ආනුෂංගික පාඩු හා අලාභ, ප්‍රමාදවීම්, වැරදි හෝ මගහැරීම් සම්බන්ධයෙන් බැංකුව වගකීමට යටත් නොවන්නේය. අර්ථලාභියාගේ අව්‍යාජභාවය හෝ සත්‍යභාවය විචාර දැන ගැනීම සම්බන්ධයෙන් බැංකුව වග කියනු නොලබන අතර එය ඉල්ලුම්කරුගේ පරම වගකීම වන්නේය.

බැංකුව විසින් භාහිර ප්‍රේෂණ ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ වෙනත් දැනට පවත්නා හෝ මෙහි මින්මතු බලාත්මක කරනු ලබන අධිකාරීන්ගේ සියලු නියෝග, තීන්දු ප්‍රකාශ, පරිපාලන රීති, නියෝග සහ චක්‍රලේඛවලට යටත් වන්නේ ය.

භාහිර ප්‍රේෂණ සම්බන්ධයෙන් බැංකුව විසින් ස්වකීය සාම්ප්‍රදායික පියවර අනුගමනය කරනු ලැබිය හැකි අතර, එසේ ක්‍රියා කිරීමේදී, ඉල්ලුම්කරු වෙනුවෙන් සන්නිවේදන ක්‍රමවේද, වාර්තාකරුවන්, උප නියෝජිතවරුන් හෝ වෙනත් නියෝජිත ආයතන භාවිතා කිරීම සඳහා බැංකුවට නිදහසක් ඇත්තේය.

(ආ) බැංකුව විසින් බැංකුවේ විකුණුම් අනුප්‍රමාණය යටතේ එම අරමුදල් ඇත්ත වශයෙන්ම ප්‍රේෂණය කරනු ලබන දිනයේදී ගිණුමේ ව්‍යවහාරික මුදල්වලින් භාහිර ප්‍රේෂණ අරමුදල් සාමාන්‍යයෙන් පරිවර්තනය කරනු ලබන්නේය. එසේ වුව ද, පරිවර්තනය කිරීමේ දිනය සහ පැවරීමේ දිනය බැංකුවේ පරම අභිමතය පරිදි තීරණය කරනු ලබයි.

(ඇ) යම් ප්‍රේෂණයක් අවලංගු කරනු ලබන අවස්ථාවකදී, වාර්තාකරන්නන්ගෙන් ලැබෙන මුදල මත සහ ප්‍රතිපූරන දිනයේදී පවතින බැංකුවේ මිලදී ගැනීමේ අනුපාතය මත පදනම්ව ප්‍රතිපූර්ණය සිදු කරනු ලැබේ. බැංකුවේම සහ එහි වාර්තාකරන්නන් හෝ නියෝජිතයන් මත එසේ දරන ලද වියදම් සඳහා මුදල් ප්‍රතිපූරණය කර ගැනීම සඳහා බැංකුවට හිමිකමක් ඇත්තේය. එකතු කරගනු ලබන සියලුම අවලංගු කිරීමේ ගාස්තු, බදු සහ කොමිස් මුදල් ආපසු ගෙවනු නොලැබේ.

(ඈ) ගෙවීම ප්‍රමාද හේතුවෙන් හෝ ගෙවීම් සඳහා උපදෙස් ලබාදීමේ ප්‍රමාදයක් සිදුවන පාඩු හෝ අලාභ සම්බන්ධයෙන්, සම්ප්‍රේෂණයේදී හෝ අන්‍යාකාරයකින් අයිතම නැතිවීම සම්බන්ධයෙන්, අයිතම, ලියුම්, විදුලි පණිවිඩ සම්ප්‍රේෂණය කිරීමේදී හෝ භාරදීමේදී සිදුවන යම් කපාහැරීම්, දූෂණ, මගහැරීම්, බිඳ වැටීම් හෝ ප්‍රමාදවීම් සම්බන්ධයෙන් හෝ බැංකුවේ හෝ එහි නියෝජිතයන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් බැංකුව වගකීමට යටත් නොවේ.

(ඉ) බැංකුවේ මිලදී ගැනීම් අනුපාතිකය යටතේ බැංකුව විසින් එම අරමුදල් බැර කරනු ලබන දිනයේදී ගිණුමේ පවතින ව්‍යවහාර මුදලින් ලැබෙන අභ්‍යන්තර ප්‍රේෂණ බැංකුව විසින් සාමාන්‍යයෙන් පරිවර්තනය කරනු ලබයි.

1.2.7.3 ගණුදෙනුකරුගේ අවදානම.

විදේශ ව්‍යවහාර මුදල් ගණුදෙනු සඳහා බැංකුව වගකීමට යටත් නොවන්නාවූ විදේශ විනිමය අවදානම් අන්තර්ගතවන බවට සම්පූර්ණ දැනුවත්බවින් යුක්තව ගණුදෙනුකරු විසින් එක් එක් විදේශ ව්‍යවහාර මුදල් ගණුදෙනුවලට ඇතුලත් විය යුතුය.

1.2.8 භාර ගැනීම සඳහා ගණුදෙනුකරුවකු විසින් ඉදිරිපත් කරන ලද යම් චෙක්පතක්, බිල්පතක්, නෝට්ටුවක්, අණකරයක්, ලාභාංශයක්, අධිකාරපත්‍රයක් හෝ වෙනත් සාධනපත්‍රයක් මත යම් පිටසන් කිරීම්, නිදහස් කිරීමක් හෝ නිදහස් කිරීම් සඳහා වගකීම් දැරීම හේතුවෙන් බැංකුව විසින් දරනු ලබන හෝ විඳිනු ලබන යම් පාඩු සම්බන්ධයෙන් ගණුදෙනුකරු විසින් එකතු කිරීමේ බැංකුවක් වශයෙන් බැංකුව හානිපූරණය කරනු ලැබිය යුතු අතර බැංකුව විසින් ලබාදී ඇති එවැනි සෑම වගකීමක්ම සෑම අවස්ථාවකදීම ගණුදෙනුකරුගේ ඉල්ලීම පරිදි ලබාදී ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

## 1.3 **කාලීන වාර්තා.**

1.3.1 **කාගිල්ස් බැංකුව** විසින් එවන ලද ගිණුම්වල සඳහන්වන සියළු ගණුදෙනු පිළිබඳ වාර්තා බැංකු ප්‍රකාශයේ සඳහන් විය යුතුය. (ලේඛනවල සහ විද්‍යුත් ප්‍රකාශවල සඳහන් විය යුතුය.) මෙම නියම හා කොන්දේසි ප්‍රකාරව බැංකුවේ වාර්තාවල සඳහන්වන බැංකුවේ තැපැල් ලිපිනය/ විද්‍යුත් ලිපිනය වෙත ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් උපදෙස් ලබා දී ඇති පරිදි කාලීන පදනමක් මත ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් වෙත එකී බැංකු ප්‍රකාශ තැපැල් කිරීම/ විද්‍යුත් ලිපිනය වෙත යොමු කිරීම සිදු කරනු ලැබිය යුතුය.

1.3.2 එවැනි ප්‍රකාශයක් ලැබීමෙන් පසුව වහාම එම ප්‍රකාශය ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් වෙත ලැබීමේ දින සිට කැලැන්ඩර දින 20කට (විස්සකට) වඩා අඩු නොවන කාලයක් ඇතුළත එම ප්‍රකාශයේ අන්තර්ගත සෑම සටහනක්ම ගිණුම්හිමියාගේම/ ගිණුම්හිමියන්ගේම සටහන් සමඟ ප්‍රතිසංස්ථාගත කරමින් විභාගකර තහවුරු කරගැනීම සඳහා ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් එකඟව සිටිනු ලබන අතර, (ඒකාබද්ධව ''ගිණුම් නොගැලපීම්'' යනුවෙන් සඳහන් කරනු ලබන) එම ප්‍රකාශයේ සඳහන් යම් වංචා සහගතවූ අනවසර ගණුදෙනු හෝ ගිණුම්හිමියා විසින් එම ගිණුම් ප්‍රකාශය සඳහා සිදුකරනු ලබන වෙනත් යම් විරෝධතා ඇතුළුව එහි සඳහන් යම් වැරදි, මග හැරීම් සහ නොගැලපීම් පිළිබඳව ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් වහාම බැංකු වෙත ලිඛිතව නිවේදනය කරනු ලැබිය යුතුය.

එසේ අධීක්ෂණ කාලසීමාව ඇතුළත බැංකු වෙත ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් ඉහතකී කරුණු නිවේදනය කිරීමට අපොහොසත්වන අවස්ථාවකදී, ගිණුම් නොගැලපීම් ඇතුළු ගිණුම් ප්‍රකාශයේ සඳහන් ගිණුම් ශේෂය, නිවැරදි බවට සම්පූර්ණ බවට සහ අවසරලත් බවට සලකනු ලැබිය යුතු මෙන්ම ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් එම කරුණු මගින් බැඳී සිටිය යුතු අතර මෙම වගන්තිය ප්‍රකාරව ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් නිවේදනයකර ඇති ගණුදෙනු හැර වඩාත්ම ආසන්නතම දිනය දක්වා සිදුකරන ලද ගණුදෙනු සම්බන්ධයෙන්වූ සියලූ වගකීම්වලින් බැංකුව නිදහස් කරනු ලැබිය යුතුය.

1.3.2.1 වෙනත් යම් ස්ථානයක නිශ්චිතව දක්වා ඇති ප්‍රතිවිපාකවලට අමතරව, ඉහත 1.3.2 වගන්තිය යටතේවූ ස්වකීය වගකීම්වලින් බැඳී සිටීම ගිණුම්හිමියා විසින්/ ගිණුම්හිමියන් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවකදී, සහ ගිණුම්හිමියාගේ ක්‍රියාකලාපය හෝ පැහැර හැරීම මගින් ස්වකීය ගිණුම් මත පාඩු ඇතිවීමට හේතු වේ නම් හෝ ඒ සඳහා දායක වේ නම්, (ඕනෑම ආකාරයක පාඩු සිදුවේ නම් බැංකුව විසින් හෝ බැංකුවට එරෙහිව යම් බදු පැනවීම්, දඩ මුදල්, ගාස්තු, දණ්ඩන විඳීමට සහ/ හෝ වූ දැරීමට සිදු වේ නම්) එවිට එවැනි පාඩු සම්බන්ධයෙන් බැංකුව ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් වෙත කිසිදු වගකීමකට බැඳී නොසිටින බවට ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් එකඟව සිටිනු ලැබේ. මෙම ගිවිසුම ප්‍රකාරව ගිණුම් ප්‍රකාශය හෝ ගණුදෙනු වාර්තාව අධීක්ෂණයකර ඇත්නම්, යම් වරදක් හෝ මඟ හැරීමක් අනාවරණය විය හැකි වන්නාවූ එම කාලයට පසුව යම් පාඩුවක් සිදුවනතාක් දුරට මෙම ගිවිසුම ප්‍රකාරව නියම කර ඇති ආකාරයට කාලීනව ගිණුම් ප්‍රකාශ අධීක්ෂණය කිරීම පැහැර හැරීම මගින් ගිණුම සම්බන්ධයෙන් පාඩු සිදුවන බවට හෝ පාඩු සිදුවීමට හේතුවන බවට සලකනු ලැබිය යුතු බවට ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් පිළිගෙන සිටිනු ලැබේ.

ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් වෙත පවතින බැංකුවේ උපරිම වගකීම බැංකුවේ බරපතළ අතපසුකිරීම හෝ චේතනාන්විත විෂමාචාරය හේතුවෙන් ගිණුම්හිමියාගෙන්/ ගිණුම්හිමියන්ගෙන් වැරදි සහගත ලෙස හෝ සාවද්‍ය ලෙස ආපසු ලබාගෙන ඇති මූලික මුදලින්වූ සැබෑ සෘජු පාඩුව වන්නේ ය.

1.3.2.2 මෙහි සඳහන් කාලීන ශේෂ ගිණුම් ප්‍රකාශයක් සහ වෙනත් යම් ප්‍රකාශයක් හෝ උපදෙස් හෝ තොරතුරු ලැබී නොමැති නම් ඒ පිළිබඳව ගණුදෙනුකරු විසින් වහාම බැංකුව වෙත ලිඛිතව නිවේදනය කරනු ලැබිය යුතුය.

1.3.3 ගිණුම් ප්‍රකාශයක පෙන්වාදී ඇති යම් ගණුදෙනුවක් සමඟ එකඟතාවයක් නොදක්වන අතෘප්තියටපත් යම් ගිණුම්හිමියකුගේ/ ගිණුම්හිමියන්ගේ එම එකඟ නොවීම පිළිබඳව හෝ ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් අන්‍යාකාරයෙන් තීරණය කරන ලද යම් ගැටලුවක් එම එකඟ නොවීම හෝ ගැටළුව ලැබී මාස දෙකක කාලයක් ඇතුළත විසඳීම සඳහා **කාගිල්ස් බැංකුව** විසින් සද්භාවී සහ සාධාරණ උත්සාහයක් දරනු ලැබිය යුතුය. එවැනි උත්සාහයකින් පසුව යම් ගණුදෙනුවක් වලංගු ගණුදෙනුවක් බවට **කාගීල්ස් බැංකුව** විසින් නිශ්චය කරනු ලබන අවස්ථාවකදී, එම කරුණ ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් වෙත සන්නිවේදනය කරනු ලැබිය යුතුය.

## 1.4 ගිණුම් වසා දැමීම.

තත්කාර්ය සඳහා හේතු දැක්වීමකින් තොරව යම් ගිණුමක් විවෘත කිරීමෙන් වැළකී සිටීමේ අයිතිය බැංකුව විසින් තබාගනු ලැබේ.

තවද, ගිණුම්හිමියාගේ/ ගිණුම්හිමියන්ගේ අවසානවරට වාර්තාකර ඇති ලිපිනය වෙත ප්‍රමාණවත් ලිඛිත දැනුම්දීමක් ලබාදීමෙන් පසුව, තත්කාර්ය සඳහා හේතු දැක්වීමකින් තොරව යම් බැංකු ගිණුමක් වසා දැමීමේ අයිතියද බැංකුව විසින් තබාගනු ලැබේ.

ගිණුමේ පවතින ශේෂය මාස හයක අඛණ්ඩ කාලසීමාවක් සඳහා ශූන්‍ය අගයක් ගනීනම් හෝ අඩු අගයක් ගනීනම් (හෝ බැංකුව විසින් කලින් කල නිශ්චය කරනු ලබන වෙනත් යම් අවම ශේෂයකට අඩු අගයක් ගනී නම්), ගිණුම්හිමියාගේ/ ගිණුම්හිමියන්ගේ අවසානවරට වාර්තාවූ ලිපිනය වෙත ගිණුම වසා දැමීම පිළිබඳ වැඩකරන දින හතක් (7) ඇතුළත ලිඛිත නිවේදනයක් ලබා දීමෙන් පසුව එවැනි ගිණුම් වසා දැමීමේ අයිතියද බැංකුව විසින් තබා ගනු ලැබේ.

ගිණුම අයහපත්ලෙස පවත්වාගෙන යනු ලබන අවස්ථාවකදී (ජංගම ගිණුමක්

සම්බන්ධයෙන් වනවිට මුදල් නොපැවතීම හේතුවෙන් චෙක්පත් 3 කට වැඩි ප්‍රමාණයක් අගරු වී ඇති අවස්ථාවකදී) හෝ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන සහ කලින් කල බලාත්මකව පවතින යම් නියෝග උල්ලංඝනය වීමක් සිදු වී ඇති බවට බැංකුව සෑහීමට පත්වන අවස්ථාවකදී, ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් වෙත දැනුම් දීමකින් තොරව බැංකුව විසින් ස්වකීය අභිමතය පරිදි එවැනි ගිණුම් වසා දමනු ලැබිය හැකිය.

# 2. බැංකු පාස් පොත් ඉතිරි කිරීමේ ගිණුම්/ ගිණුම් ප්‍රකාශ/ විද්‍යුත් ප්‍රකාශන ඉතුරුම් ගිණුම්.

## 2.1 ඇතුළත්වීමේ නිර්ණායක.

### 2.1.1 **මූලික තැන්පතුව.**

බැංකු පාස් පොත්/ ගිණුම් ප්‍රකාශ/ විද්‍යුත් ප්‍රකාශන ඉතුරුම් ගිණුමක් සඳහාවූ අවම තැන්පතුව රු. 1,000.00 (රුපියල් එක් දහසක් පමණයි) වේ. පූර්ව නිවේදනයකින් තොරව බැංකුව විසින් මූලික තැන්පතුව වෙනස් කරනු ලැබිය හැකි අතර කලින් කල බැංකුව විසින් හඳුන්වා දෙනු ලබන විවිධ ඉතුරුම් ගිණුම් සේවා මත පදනම්ව මෙම මුලික තැන්පතුව වෙනස් විය හැකිය. බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි යම් අඩු මූලික තැන්පතුවක් සහිතව ගිණුම් විවෘත කරනු ලැබිය හැකිය.

### 2.1.2 පොලිය.

දෛනිකව පවතින ශේෂයක් මත පොලිය ගණනය කරනු ලැබිය යුතු අතර මාසය අවසානයේදී පවත්නා අනුපාතිකය යටතේ නිශ්චිත ගිණුම වෙත පොලී මුදල් බැර කරනු ලැබේ.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ආකාරයට ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍රය මත ස්වකීය බදු තත්ත්වය සහ නේවාසික තත්ත්වය පිළිබඳ ව්‍යවස්ථාපිත ප්‍රකාශයක් සම්පූර්ණ කරනු ලැබිය යුතුය. ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් භාරදෙනු ලබන ප්‍රකාශය ප්‍රකාරව අදාළ කාලසීමාව සඳහා ගෙවිය යුතු පොලී මුදලින් බැංකුව

විසින් පොලී ගෙවීම් මත රැඳවුම් බද්ද අඩු කරනු ලැබේ.

## 2.2 බැංකු පාස් පොත් ඉතිරි කිරීමේ ගිණුම්.

2.2.1 ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් වෙත බැංකුව විසින් සපයා ඇති බැංකු පාස්පොත ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් ඉතා උනන්දුවෙන් ආරක්ෂා කරනු ලැබිය යුතුය.

2.2.2 බැංකු පාස් පොත නැතිවී ඇති හෝ විනාශවී ඇති අවස්ථාවකදී, ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් ඒ පිළිබඳව වහාම බැංකුව වෙත දැනුම් දිය යුතුය. ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් බැංකු පාස් පොත නැති කර ගැනීම හෝ විනාශ කර ගැනීම සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමක් භාර ගෙන සිටිනු නොලැබේ. ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් බැංකුව වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන හානිපූර්ණ ලිපියක් ලැබීමෙන් පසුව පමණක් බැංකුව විසින් ප්‍රතියෝජන බැංකු පාස් පොතක් නිකුත් කරනු ලැබේ.

යථා පරිදි සම්පූර්ණ කරන ලද මුදල් ආපසු ගැනීමේ ආකෘතිපත්‍රයක් සමග පුද්ගල හඳුනාගැනීමක් ඉදිරිපත් කිරීමෙන් පසුව මුදල් ආපසු ලබා ගැනීම් සඳහා අවසර දෙනු ලැබේ. අදාල අවස්ථාවලදී, ශ්‍රී ලංකා රජය විසින් පනවනු ලබන මුද්දර ගාස්තු හෝ වෙනත් යම් ව්‍යවස්ථාපිත ගාස්තු/ බදු/ පැනවීම ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් ගෙවනු ලැබිය යුතුය.

2.2.3 අවශ්‍ය අවස්ථාවලදී, බැංකුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු බැංකු පාස්පොත මත ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් කිසිදු සටහනක් සිදු නොකළ යුතුය. බැංකු පාස්පොත මාරු කිරීම හෝ පැවරීම සිදු නොකළ යුතු අතර ඇපයක් වශයෙන් පොරොන්දුවකට බැඳීමක් සඳහාද භාවිත කරනු ලැබිය නොහැකිවේ. සටහන්වල නිවැරදි බව තහවුරු කිරීම පිණිස එක් එක් ගණුදෙනුවෙන් පසුව බැංකු පාස් පොත පරික්ෂා කරනු ලැබිය යුතුය. යම් වරදක් ඇත්නම් ඒ පිළිබඳව වහාම බැංකුව වෙත නිවේදනය කරනු ලැබිය යුතුය.

2.2.4 බැංකු පාස්පොතෙහි සටහන් කිරීමෙන් තොරව මුදල් තැන්පත් කිරීම් සිදු කර තිබිය හැකි බැවින් හෝ යම් අයිතම අයකර/ හරකර තිබිය හැකි බැවින් බැංකු පාස්පොතෙහි අත්‍යවශයෙන්ම දැනට පවත්නා (වර්තමාන) ගිණුම් ශේෂය පෙන්නුම් නොකර තිබිය හැකිය.

2.2.5 බැංකු පාස්පොත නිතිපතාම යාවත්කාලීන කරනු ලැබිය යුතුය.

2.2.6 බැංකුවෙන් බැංකු උපදෙස් පිළිබඳ පිටපත් පසුව ඉල්ලා සිටිනු ලැබුහොත්, මෙම සේවාවන් සැපයීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සඳහා බැංකුව විසින් අයිතිය තබාගනු ලැබේ.

## 2.3 ප්‍රකාශන/ විද්‍යුත් ප්‍රකාශන ඉතුරුම් ගිණුම්.

2.3.1 ගිණුම් සම්බන්ධ සියලු ගණුදෙනුවල වාර්තාවක් **කාගිල්ස් බැංකුව** විසින් යවනු ලබන ප්‍රකාශනයේ අන්තර්ගත විය යුතුය. මෙම නියම හා කොන්දේසි ප්‍රකාරව බැංකුවේ වාර්තාවල පවතින ගිණුම්හිමියාගේ/ ගිණුම්හිමියන්ගේ තැපැල් ලිපිනය/ විද්‍යුත් ලිපිනය වෙත උපදෙස් ලබාදී ඇති ආකාරයට කාලීන පදනමක් මත එම ගිණුම් ප්‍රකාශ තැපැල් කිරීම/ ඊමේල් කිරීම සිදු කළ යුතුය.

### 2.3.2 ප්‍රකාශන ඉතුරුම් මත මුදල් ආපසු ලබා ගැනීම.

පුද්ගල අනන්‍යතාව හෙළිදරව් කර ගැනීම මත මුදල් ආපසු ලබා ගැනීම සඳහා අවසර දෙනු ලැබේ. අදාල අවස්ථාවලදී, ශ්‍රී ලංකා රජය විසින් පනවනු ලබන මුද්දර ගාස්තු හෝ වෙනත් යම් ව්‍යවස්ථාපිත ගාස්තු/ බදු/ පැනවීම් ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් ගෙවනු ලැබිය යුතුය.

2.4 යම් ගණුදෙනුකරුවකුගේ ඉල්ලීම පරිදි ගෙවීම් අණකරයක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවකදී, එම මුල් ගෙවීම් අණකරය සහ ගණුදෙනුකරුගේ/ ගණුදෙනුකරුවන්ගෙන් හානිපූර්ණ ලිපියක් ලබා ගැනීමෙන් තොරව, බැංකුව විසින් කිසිදු අවලංගු කිරීමේ ඉල්ලීමක් භාරගනු නොලැබේ.

# 3. ජංගම ගිණුම්.

## 3.1 ඇතුළත්වීමේ නිර්ණායක.

3.1.1 බැංකුව විසින් පිළිගනු ලැබිය හැකි වෙනත් ජංගම ගිණුම්හිමියකුගෙන්

ලබාගන්නා හඳුන්වාදීමක් ඉදිරිපත් කිරීම මගින් හෝ වෙනත් යම් වාණිජ බැංකුවක යම් අපේක්ෂිත ගණුදෙනුකරු/ ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් ජංගම ගිණුමක් පවත්වාගෙන යනු ලබන අවස්ථාවකදී, එම වෙනත් වාණිජ බැංකුවෙන් ලබා ගන්නා යොමු කිරීමේ ලිපියක් ඉදිරිපත් කිරීම මගින් යම් තැනැත්තකු/ තැනැත්තන් විසින් රුපියල් ජංගම ගිණුමක් විවෘත කරනු ලැබිය හැකිය.

3.1.2 රු. 20,000/= ක අවම තැන්පතුවකින් පුද්ගලික ජංගම ගිණුමක් විවෘත කරනු ලැබිය හැකිය. පූර්ව දැනුම් දීමකින් තොරව රුපියල් ජංගම ගිණුමක් සඳහා අවශ්‍යවන මූලික තැන්පතුව බැංකුව විසින් වෙනස් කරනු ලැබිය හැකිය. බැංකුවේ පරම අභිමතය පරිදි යම් අඩු මූලික තැන්පතු යටතේ බැංකුව විසින් ගිණුම් විවෘත කරනු ලැබිය හැකිය. එසේ වුවද, කලින් කල අවම ශේෂය අධීක්ෂණය කිරීම සඳහා බැංකුවට අයිතියක් ඇත්තේය. ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් එම අවම ශේෂය පවත්වාගෙන යෑම සපුරාලනු නොලබයි නම්, බැංකුවේ පරම අභිමතය පරිදි කලින් කල වෙනස් කරනු ලැබිය හැකිවූ පරිදි ගිණුම මතවූ ගාස්තු පැනවීම ප්‍රකාරව බැංකුව විසින් සේවා ගාස්තුවක් අය කරනු ලැබේ.

3.1.3 රුපියල් ජංගම ගිණුම්වල බැරකම් ශේෂය මත බැංකුව විසින් කිසිදු පොළී මුදලක් ගෙවනු නොලැබේ.

3.1.4 ගණුදෙනුකරුගේ ගෙවීම් සපුරාලීමේ කාර්ය සඳහා හෝ ගණුදෙනුකරුගේ උපදෙස් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා බැංකුව විසින් ස්වකීය අභිමතය පරිදි (එසේ ක්‍රියා කිරීමට බැඳී නොසිටියද) ගණුදෙනුකරු වෙත බැරකම් දීර්ඝ කිරීම, මූල්‍ය පහසුකම් ප්‍රදානය කිරීම හෝ මුදල් අත්තිකාරම් ලබා දීම සිදු කරනු ලැබිය හැකි අතර එවැනි අවස්ථාවකදී ඒ සම්බන්ධයෙන් උපචිතවන ගණුදෙනුකරුගේ යම් සහ සියලු වගකීම් (බැංකුව වෙත ලිඛිතව අන්‍යාකාරයකින් එකඟ වී ඇත්නම් මිස) බැංකු විසින් ඉල්ලා සිටීමේදී ගණුදෙනුකරු විසින් ආපසු ගෙවනු ලැබිය යුතු අතර ඒ සඳහා අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වී ඇති අනුපාතිකයක් යටතේ (හෝ එවැනි එකඟතාවයක් නොමැති අවස්ථාවකදී, අභ්‍යන්තර කාර්ය පටිපාටි ප්‍රකාරව බැංකුව විසින් සාධාරණ ලෙස තීරණය කරනු ලබන වෙනත් යම් අනුපාතිකයක් යටතේ) පොලියක් ගෙවීමට යටත් වන්නේය.

## 3.2 චෙක්පත්.

3.2.1 ඉල්ලීමක් කිරීමෙන් පසුව රුපියල් ජංගම ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් වෙත ආකර්ෂණ තීන්ත වර්ණක හඳුනාගැනීම් සහිතව මුද්‍රිත චෙක් පොතක්/ චෙක්පොත් සපයනු ලැබිය යුතුය. රජයේ පවත්නා මුද්දර ගාස්තු ඇත්නම් එම ගාස්තු සහ මුද්‍රණ පිරිවැය ආවරණය කිරීම සඳහාවූ ගාස්තු ඇතුළුව මෙම චෙක්පොත් සැපයීම සඳහා ගාස්තු අය කරනු ලැබේ.

3.2.2 චෙක්පොත් ඉල්ලමින් සිදු කරනු ලබන සියලුම ඉල්ලීම් ලැබීමෙන් පසුව, ගිණුම්හිමියා/ගිණුම්හිමියන් මගින් එකතු කර ගැනීම සඳහා හෝ (පූර්වයෙන් නම් කරනු ලබන තැනැත්තකු වන) නම් කළ තැනැත්තකු හරහා භාරගැනීම පිණිස හෝ බැංකුවේ වාර්තාගත වී ඇති ලිපිනය වෙත තැපැල් කිරීම මගින් බැංකුව විසින් එම ඉල්ලා සිටිනු ලැබූ චෙක්පොත් ගිණුම්හිමියා/ගිණුම්හිමියන් වෙත භාර දෙනු ලැබිය යුතුය. භාරදීමේ ක්‍රම මගින් සිදුවිය හැකි යම් ප්‍රමාදයක් හෝ නැතිවීමක් සම්බන්ධයෙන් බැංකුව විසින් කිසිදු වගකීමක් භාර ගෙන සිටිනු නොලැබේ.

3.2.3 අලුත් චෙක් පොතක් ලැබීමෙන් පසුව, චෙක් පොත භාවිතා කිරීමට පෙරාතුව ඒ මත මුද්‍රණය කර ඇති චෙක්පත් අනුක්‍රමික අංක, ගිණුම් අංකය සහ ගිණුම්හිමියාගේ/ ගිණුම්හිමියන්ගේ නම් මෙන්ම චෙක්පත් ගණන පිළිබඳව ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් තහවුරු කර ගනු ලැබිය යුතුය. යම් නොගැළපීම් ඇත්නම් ඒ පිළිබඳව වහාම බැංකුව වෙත වාර්තා කරනු ලැබිය යුතුය.

3.2.4 යම් චෙක්පතක් ලියා අත්සන් කිරීමට පෙරාතුව, චෙක් පොත්වල ආවරණ පිටුවේ ඇතුල් පැත්තේ මුද්‍රණය කර ඇති චෙක්පත් නිකුත් කිරීම පිළිබඳ කොන්දේසි ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් කියවනු ලැබිය යුතුය. ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් එම කොන්දේසි සහ කලින් කළ නිකුත් කරනු ලබන එම කොන්දේසි වල යම් සංශෝධන මගින් බැඳී සිටිනු ලැබිය යුතුය.

3.2.5 බැංකුව වෙත ලබා දී ඇති බලය පැවරීම සහ ආදර්ශක අත්සන (අත්සන්) ප්‍රකාරව ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් චෙක්පත් අත්සන් කරනු ලැබිය යුතුය. අත්සන්වල හෝ අත්සන්කරුවන්ගේ යම් වෙනසක් සිදු වුවහොත්, ඒ පිළිබඳව වහාම ලිඛිතව බැංකුව වෙත නිවේදනය කරනු ලැබිය යුතුය.

3.2.6 වංචාසහගත වෙනස් කිරීම් සඳහා පහසුකම් නොලැබෙන පරිදි හෝ බැංකුව

නොමඟ යවන ආකාරයට හෝ බැංකුව වැරදි ලෙස යොමු කරවන ආකාරයට චෙක්පත් ලියා අත්සන් කිරීම සිදු නොකළ යුතුය.

3.2.7 නොමැකෙන තීන්තෙන් (කළු/නිල්) පැහැදිලිව බැංකුව විසින් සපයන ලද චෙක්පත් මත පමණක් චෙක්පත් ලියා අත්සන් කරනු ලැබිය යුතුය. එක් එක් වෙනස් කිරීම් චෙක්පත් ලියන්නන්ගේ සම්පූර්ණ අත්සන/ අත්සන් මගින් තහවුරු කරනු ලැබිය යුතුය. චෙක්පත් ලිවීම සඳහා විද්‍යුත්/ ඉලෙක්ට්‍රොනික යතුරුලියනයන් සහ මැකිය හැකි තීන්ත භාවිත කරනු නොලැබිය යුතුය. පහසුවෙන් හඳුනාගත නොහැකි වෙනස් කිරීම් හේතුවෙන් උපචිතවන පාඩු සම්බන්ධයෙන් බැංකුව වගකියනු නොලබන බව ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් පිළිගෙන සිටිනු ලැබේ.

### 3.2.8 ගෙවීම් නතර කිරීම.

චෙක්පත් නැතිවී/ සොරකම්කර හෝ අස්ථානගතවී ඇති අවස්ථාවකදී, චෙක්පත් අංකය, දිනය, මුදල සහ ආදාහකයාගේ නම සඳහන් කරමින් ගෙවීම් නතර කරන ලෙස ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් වහාම බැංකුව වෙත ලිඛිතව උපදෙස් ලබා දිය යුතු වේ. එම උපදෙස් ලැබීමේ අවස්ථාව දක්වා අදාළ චෙක්පත/ චෙක්පත් සඳහා ගෙවීම් සිදුකර නැත්නම් පමණක් එවැනි සියලුම උපදෙස් බලාත්මක කරනු ලැබිය හැකිවේ. දුරකථනය හරහා ලබාදෙන ගෙවීම් නතර කිරීමේ උපදෙස් පැය 48 ක කාලසීමාවක් ඇතුළත තහවුරු කරනු ලැබිය යුතුය. පැය 48ක කාල සීමාවක් ඇතුළත එවැනි ලිඛිත උපදෙස් ලැබී නොමැති අවස්ථාවකදී, ගිණුම්හිමියා/ගිණුම්හිමියන් වෙත දැනුම් දීමකින් තොරව එම ගෙවීම් නතර කිරීමේ උපදෙස් අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතු වේ. පැය 48 ක කාල සීමාවක් ඇතුළත එසේ ලිඛිතව තහවුරු කරනු ලබන ගෙවීම් නතර කිරීමේ උපදෙස් මත ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් බැංකුව වගකීමට යටත් නොවන්නේය.

චෙක්පතක් සඳහා ගෙවීම් කිරීමට දෙන ලද නියමය අවලංගු කරන ලෙස ඉල්ලා ඇති අවස්ථාවකදී, ඉදිරිපත් වී ඇති චෙක් පත සඳහා ගෙවීම් නොකිරීමෙන් ද උපචිත වන පාඩුවට එරෙහිව ගිණුම්හිමියා විසින් බැංකුව හානිපූරණය කර නිදහස්ව තබනු ලබන බවට ගිණුම්හිමියා විසින් එකඟව සිටිනු ලබන අතර චෙක්පත් සොයා ගනු ලැබුවහොත් හෝ විනාශ වී ඇත්නම් ඒ පිළිබඳ වහාම බැංකුව වෙත ලිඛිතව දැනුම් දිය යුතු අතර, ගෙවීම් නතර කිරීමේ නියමය අවලංගු

කිරීමට අවශ්‍ය වේ නම්, අතපසුවීමක් හරහා හෝ ප්‍රමාද දෝෂයකින් හෝ අයිතමය පිළිබඳ නොමග යැවීම හරහා එම අයිතමය සඳහා බැංකුව විසින් ගෙවීමක් ඇත්නම් හෝ සහතික කර ඇත්නම් ඒ සම්බන්ධයෙන් බැංකුව වගකීමට යටත් නොවන බවටද එකඟව සිටිනු ලැබේ. පූර්ව නියෝගය අවලංගු කරන ලෙස කරන ලද ඉල්ලීමක් ලිඛිතව ඉදිරිපත් කර ඇත්නම් මිස සහ ගෙවීම් නතර කරන ලෙස ඉල්ලා ඇති චෙක්පත පිළිබඳ නිවැරදි තොරතුරු එම ඉල්ලීමේ අන්තර්ගත වේ නම් මිස, එවැනි පූර්ව නියෝගය අවලංගු කරන ලෙස කරන ලද ඉල්ලීමක් භාරගනු නොලැබේ. පූර්ව නියෝගයක් අවලංගු කරන ලෙස කරන ලද ඉල්ලීමක් ද ලිඛිතව විය යුතු අතර එම අවලංගු කිරීම ලැබීමේ කාලය හා ගෙවීම් නතර කරන ලද චෙක්පත ඉදිරිපත් කිරීම යන අවස්ථා දෙක අතර සාධාරණ කාලසීමාවක් අවසන් වන තෙක්, එම පූර්ව නියෝගය අවලංගු කරන ලෙස කරන ලද ඉල්ලීමක් බලාත්මක නොවන්නේය. ලිඛිතව අලුත් කරනු ලැබුවහොත් මිස, ගෙවීම් නතර කිරීමේ නියමයක් මාස හයක කාලයක් සඳහා පමණක් බලාත්මක වේ. යම් ගණුදෙනුකරුවකු විසින් චෙක්පත් ගෙවීම් නතර කරන ලෙස කරන ලද එක් එක් ඉල්ලීම සඳහා බැංකුව විසින් (බැංකුවේ අභිමතමය පරිදි නියම කරනු ලබන) ගාස්තුවක් අය කරනු ලැබේ.

3.2.9 භාවිතා නොකරන අවස්ථාවලදී චෙක්පොත් ආරක්ෂිත ස්ථානයක තබා ඇති බවට ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් විසින් සහතික විය යුතුය.

3.2.10 ගණුදෙනුකරු විසින් හෝ බැංකුව විසින් යම් ගිණුමක් වසා දැමීමෙන් පසුව, ගණුදෙනුකරු වෙත කලින් නිකුත් කරන ලද සියලු චෙක්පත් ආකෘතිපත්‍ර හා භාවිත නොකර පවතින සියලු චෙක්පත් බැංකුවේ දේපලක් වන අතර එම චෙක්පත් ගණුදෙනුකරු විසින් වහාම බැංකුව වෙත ආපසු භාර දෙනු ලැබිය යුතුය.

3.2.11 මෙහි සඳහන් වෙනත් නියම හා කොන්දේසි වලට යටත්ව, පවත්නා සම්පූර්ණ අරමුදල් ප්‍රමාණය ඉක්මවමින් බැංකුව වෙත එකවර චෙක්පත් හෝ බිල්පත් කිහිපයක් ඉදිරිපත් වී ඇති අවස්ථාවකදී, මුදල් ආපසු ලබා ගැනීම සිදු කරනුයේ යම් ගිණුමක් මත ද එම ගිණුමේ පවත්නා අරමුදල් තුලින් මුදල් ගෙවීම සඳහා කුමන චෙක්පත් හෝ බිල්පත් තෝරාගනු ලැබිය යුතුද යන්න තීරණය කිරීම සඳහා බැංකුවට හිමිකමක් ඇත්තේය.

### 3.3 මුදල් ආපසු ගැනීම්.

3.3.1 බැංකුව සමඟ ඇති කර ගනු ලබන විශේෂ පූර්ව වැඩ පිළිවෙළක් ඇතිව මිස, ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් ස්වකීය ගිණුම්වලින් පවතින මුදල් ප්‍රමාණය ඉක්මවා මුදල් ආපසු ලබා නොගත යුතුය. ගිණුමේ ප්‍රමාණවත් මුදල් නොමැති අවස්ථාවකදී, චෙක්පත් අගරු කිරීම සඳහා/ චෙක්පත් ගෙවීම් භාර නොගැනීම සඳහා බැංකුවට අයිතියක් ඇත්තේය. අගරු වන චෙක්පත් සඳහා ගාස්තුවක් අය කිරීමේ අයිතිය ද බැංකුව විසින් තබාගනු ලැබේ. ගිණුමේ පවතින මුදල් ප්‍රමාණය ඉක්මවමින් යම් චෙක්පතක්/ චෙක්පත් බැංකුවේ පරම අභිමතය පරිදි භාර ගනු ලැබිය හැකිය. එවැනි අවස්ථාවලදී, ඉල්ලා සිටීමේදී කොන්දේසි විරහිතව පොළිය සහ බැංකු ගාස්තුද සමඟ එසේ වැඩිපුර ලබාගත් මුදල් ප්‍රමාණය ආපසු ගෙවීම සඳහා ගිණුම්හිමියා/ගිණුම්හිමියන් බැඳී සිටියි. මෙය ඕනෑම ආකාරයකින් අයිරා පහසුකම් ප්‍රදානය කිරීම සඳහා බැංකුව බැඳී සිටින බවට ප්‍රකාශිත හෝ ව්‍යංගිත ගිවිසුමක් ලෙස සලකනු නොලැබිය යුතුය.

3.3.2 කලින් කල නීතිය මගින් නිශ්චිතව දක්වනු ලබන ගණුදෙනු සම්බන්ධයෙන්වූ සියලු පවත්නා රජයේ ගාස්තු සහ බදු මුදල් ගිණුම්හිමියා/ගිණුම්හිමියන් වෙතින් අයකරනු ලැබේ. නීතියේ සඳහන් විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් ඉදිරිපත් කරනු ලබන යම් හිමිකම් පෑම් හෝ දරන ලද පාඩු හෝ අන්‍යාකාරයෙන් දරන ලද වෙනත් දේ සම්බන්ධයෙන් බැංකුව විසින් කිසිදු වගකීමක් භාර ගෙන සිටිනු නොලැබේ.

## 4. වාර තැන්පතු.

### 4.1 ඇතුලත්වීමේ නිර්ණායක.

4.1.1 රුපියල් කාලීන තැන්පතු ගිණුමක් විවෘත කරනු ලැබිය හැකි අවම තැන්පතුව ශ්‍රී ලංකා රුපියල් දස දහසක් (රු. 10,000/-) වන්නේය. බැංකුව විසින් පූර්ව නිවේදනයකින් තොරව රුපියල් කාලීන තැන්පතු ගිණුමක් සඳහා අවශ්‍ය වන ආරම්භක තැන්පතුව වෙනස් කරනු ලැබිය හැකිය. බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි අඩු ආරම්භක තැන්පතු අගයක් සහිතව ගිණුම් විවෘත කරනු ලැබිය හැකිය.

### 4.2 මුදල් ආපසු ගැනීම්.

4.2.1 කල්පිරීමේදී පමණක් කාලීන තැන්පතු ඉහළ නංවනු ලැබේ. අරමුදල් නැවත ආයෝජනය කිරීම සඳහා උපදෙස් ලබාදී නොමැති නම් පමණක්, කල්පිරීමේ දිනයෙන් ඉක්බිතිවම එළඹෙන වැඩ කරන දිනයේදී යම් කාලීන තැන්පතුවක කල්පිරීමේ ප්‍රතිෂ්ඨා මුදල් ලබාගත හැකි වේ.

4.2.2 පටහැනිව නිශ්චිත උපදෙස් ලබාදී නොමැති අවස්ථාවකදී, කල්පිරීමේ දිනයේදී පවතින පොලී අනුපාතිකය යටතේ සමාන කාලසීමාවක් සඳහා කල්පිරීමේදී කාලීන තැන්පතු අලුත් කරනු ලැබේ.

4.2.3 එසේ වුවද, ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් යථා පරිදි බලය පවරන ලද ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසුව (බැංකුව වෙත ලබා දී ඇති බලය පැවරීමට අනුව) බැංකුව විසින් කල්පිරීමට පෙරාතුව ස්වකීය අභිමතය පරිදි වාර තැන්පතු නිදහස් කරනු ලැබිය හැකිය. බැංකුවේ පරම අභිමතය පරිදි කල් පිරීමට පෙරාතුව නිදහස් කරනු ලබන වාර තැන්පතු, බැංකුවේ එම වාර තැන්පතු පවතින කාලසීමාව මත පදනම්ව දඩ පොළියක් ගෙවීම සඳහා යටත් වන්නේය.

4.2.4 කල් පිරීමට පෙරාතුව තවදුරටත් වූ තැන්පතුවක් සමඟ ඒකාබද්ධ කිරීම සඳහා සිදු කරනු ලබන යම් තැන්පතු ඉහළ නැංවීමක් සහ කල්පිරීමට පෙරාතුව පවත්නා තැන්පතු මුදල් ප්‍රමාණය වැඩි කිරීම පිණිස සිදු කරනු ලබන ප්‍රති-තැන්පත් කිරීම්ද, බැංකුව සමග තැන්පතුව පවතින කාලසීමාව මත පදනම්ව දඩ ගාස්තු අයකිරීමට යටත් වන්නේ ය.

4.2.5 වාර තැන්පතු මත මුදල් ආපසු ගැනීම සහ පොළිය ගෙවීම් සම්බන්ධයෙන් නියාමකවරුන් විසින් සීමාවන් පනවනු ලබන අවස්ථාවකදී, ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් එම සීමා පැනවීම් මගින් බැඳී සිටිය යුතුය.

### 4.3 පොළිය.

4.3.1 කල් පිරෙන තෙක් පවත්නා වාර තැන්පතු මත ගිවිසුම්ගත පරිදි බැංකුව විසින් පොලී අනුපාතිකය වෙනස් කරනු නොලබන අවස්ථාවකදී හැර, රුපියල් වාර තැන්පතු සම්බන්ධ පොලී අනුපාතිකය දැනුම් දීමකින් තොරව වෙනස් වීමට යටත් වන්නේය.

## 5. ළමා ඉතුරුම් ගිණුම් (බාලවයස්කාර ඉතුරුම්)

## 5.1 ඇතුලත්වීමේ නිර්ණායක.

5.1.1 බාලවයස්කරුවකුගේ නමින් (ගිණුම්හිමියා) **කාගිල්ස් බැංකු** ළමා ඉතුරුම් ගිණුමක් (ගිණුම) විවෘත කරනු ලැබිය හැකි අතර එම ගිණුම සඳහා ඕනෑම තැනැත්තකු විසින් මුදල් තැන්පත් කරනු ලැබිය හැකිය.

5.1.2 මෙම ගිණුම විවෘත කිරීම සඳහා අවශ්‍ය අවම ආරම්භක තැන්පතු මුදල රුපියල් පන්සියයක් (රු. 500.00) වන අතර එය කලින් කල සංශෝධනය වීමට යටත් වේ.

5.1.3 උප්පැන්න ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද ගිණුම්හිමියාගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත බැංකුව විසින් පරීක්ෂා කිරීම සඳහා ගිණුම විවෘත කරනු ලබන අවස්ථාවේදී ඉදිරිපත් කරනු ලැබිය යුතුය. බැංකුව විසින් ස්වකීය වාර්තා සඳහා එම උප්පැන්න සහතිකයේ සත්‍ය පිටපතක් තබාගනු ලැබේ.

5.1.4 මෙම ගිණුම සඳහා අදාළ වන පොලී අනුපාතිකය පූර්ව නිවේදනයකින් තොරව වෙනස්වීමට යටත් වන්නේය.

5.1.5 ගිණුම් මත නිදහස් කරනු ලබන ගණුදෙනු යාවත්කාලීන කිරීම සඳහා බැංකු පාස්පොතක් ගිණුම්හිමියා වෙත සපයනු ලැබේ.

5.1.6 ගිණුම්හිමියාගේ වයස අවුරුදු 18 ට වැඩි වීමෙන් පසුව, සාමාන්‍ය ඉතුරුම් ගිණුම් පොලී අනුපාතික අදාළ වන්නේය. බාල වයස්කරුගේ ජාතික හැඳුනුම්පත භාරදීමෙන් පසුව සහ අවශ්‍ය ලිපි ලේඛන සම්පූර්ණ කිරීමෙන් පසුව, (අවම සාමාන්‍ය ඉතුරුම් ගිණුම් ශේෂ අවශ්‍යතාවයට යටත්ව) ගිණුම සාමාන්‍ය ඉතුරුම් ගිණුමක් බවට පරිවර්තනය කරනු ලැබේ.

5.1.7 ගිණුම්හිමියාගේ මරණය සිදු වන අවස්ථාවකදී, ගිණුමේ පවතින ප්‍රතිෂ්ඨා මුදල්, අන්තිම කැමතිපත්‍ර නොලියූ දේපළ අනුප්‍රාප්තිය පිළිබඳ ශ්‍රී ලංකාවේ පවතින නීතිය ප්‍රකාරව ප්‍රතිපූරණය කරනු ලැබිය යුතුය.

5.1.8 ගිණුම් විවෘත කරනු ලබනුයේ යම් ගිණුම්හිමියකුගේ නමින් ද එම ගිණුම්හිමියා

ගිණුම සඳහා කර ඇති තැන්පත් මුදල්වල අර්ථලාභියා වන්නේය. එම නිසා ගිණුම්හිමියා වයස අවුරුදු 18 ට එළඹෙන තෙක්, ගිණුමෙන් කිසිදු ආකාරයකින් මුදලක් ආපසු ගැනීම සඳහා/ ගිණුම වසා දැමීම සඳහා අවසර දෙනු නොලැබේ. එසේ වුවද, දෙමව්පියන් විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මත දෙමව්පියන් ජීවත්ව නොසිටී නම්, අධිකරණය විසින් පත් කරනු ලබන භාරකරුවකු විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මත උසස් අධ්‍යාපනය හෝ හදිසි වෛද්‍ය හේතු වැනි ගිණුම්හිමියාගේ ප්‍රතිලාභය සලසන්නාවූ යම් කාර්ය හෝ හේතු සඳහා බැංකුවේ පරම අභිමතය පරිදි පමණක් එම ගිණුමෙන් මුදල් ආපසු ගැනීමට අවසර දෙනු ලැබිය හැකිය. එවැනි මුදල් ආපසු ගැනීම්/ ගිණුම වසා දැමීම් සම්බන්ධ ඉල්ලීමක වලංගුභාවය තීරණය කිරීමේ පරම අයිතිය බැංකුව විසින් තබා ගන්නා අතර එවැනි කරුණු වලංගුභාවයට පත් කිරීම සඳහා ලේඛනමය සාක්ෂි ඉල්ලා සිටිනු ලැබිය හැකිය.

5.1.9 ගණුදෙනු වාර්තා සුරක්ෂිතව තබා ගැනීම සම්බන්ධයෙන් (සාමූහිකව ''ගණුදෙනුකරු'' යනුවෙන් සඳහන් කරනු ලබන) ගිණුම්හිමියා/ දෙමව්පියන්/ භාරකරුවන් වගකියනු ලැබිය යුතුය. බැංකුවෙන් ගණුදෙනු විස්තර, බැංකු ප්‍රකාශන ඉල්ලා සිටිනු ලබන අවස්ථාවකදී, බැංකුවේ ප්‍රසිද්ධ කරන ලද අයබදු ප්‍රකාරව මෙම සේවය සැපයීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සඳහා බැංකුව විසින් අයිතිය තබාගනු ලැබේ.

5.1.10 අත්වැරදීමකින් බැංකුව විසින් ගණුදෙනුකරුගේ ගිණුමට මුදල් බැර කර ඇති අවස්ථාවකදී, ඕනෑම අදියරකදී එම සටහන ආපසු ලබා ගැනීම සඳහා සහ/හෝ ගණුදෙනුකරුගෙන් එම මුදල් අයකර ගැනීම සඳහා බැංකුවට හිමිකමක් ඇත්තේය.

## 6. ඇමතුම් මධ්‍යස්ථාන සේවාවන් සහ ඇමතුම් මධ්‍යස්ථාන සේවා හානිපූරණය.

මෙහි මින්මතු ඇමතුම් මධ්‍යස්ථාන සේවා සහ ඇමතුම් මධ්‍යස්ථාන සේවා හානිපූර්ණය සඳහා අදාලවන නියම හා කොන්දේසි (6.2 වගන්තියෙහි) සඳහන් වන අතර, ''ගිණුම'' යන යෙදුමෙන් සාමාන්‍ය ඉතුරුම් ගිණුම්, ජංගම ගිණුම්, කාලීන තැන්පතු, බැංකුවෙන් ලබා ගන්නා ණය මුදල් සහ දැන් හෝ අනාගතයේදී බැංකුව විසින් හඳුන්වා දෙනු ලැබිය හැකි වෙනත් යම් ස්වභාවයක නිෂ්පාදන හෝ සේවා අදහස් වන අතර එවැනි ගිණුමක්/ගිණුම් දරනු ලබන තැනැත්තා ''ගිණුම්හිමියා'' යනුවෙන් හඳුන්වනු ලැබේ.

6.1 බැංකුව විසින් සපයනු ලබන ඇමතුම් මධ්‍යස්ථාන සේවා සඳහා (බැංකුවේ පරම අභිමතය පරිදි) පහත දැක්වෙන කරුණුවලට අදාළ දුරකථන උපදෙස් ඇතුලත් වේ.:- එනම් -

6.1.1 ගිණුම් ශේෂය පිළිබඳ විමසීම්, (ගිණුම්හිමියාගේ ගිණුමට අදාල) අවසාන ගණුදෙනු විස්තර, විනිමය අනුපාතික සහ තැන්පතු අනුපාතික;

6.1.2 (තෝරාගත් ගිණුම සඳහා) ගිණුම් ප්‍රකාශ ඉල්ලා සිටීම්, චෙක්පොත් (දෙවන චෙක් පොතේ සිට ඉන් පසුව එන චෙක් පොත්) සහ ගිණුම්හිමියාගේ ගිණුමට අදාල චෙක්පත් ගෙවීම් නතර කිරීම් සහ අදාළ බැංකු ශාඛාව වෙත පැමිණෙන ගමන් මාර්ගය;

6.1.3 බැංකුව විසින් කලින් කල හඳුන්වාදෙනු ලබන වෙනත් යම් බැංකු කටයුතු හා ආයෝජන සේවාවන්.

6.2 උපකරණ දෝෂ සහිත වීම හෝ අක්‍රීය වීම ඇතුළුව බැංකුවේ පාලනයෙන් තොරව පවතින හේතු සඳහා පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් බලපාන හේතු අනුව දුරකථන උපදෙස් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම සම්බන්ධයෙන් බැංකුව ගිණුම්හිමියා/ගිණුම්හිමියන් වෙත වගකීමට යටත් නොවන අතර දුරකථන උපදෙස් පිළිගැනීම සහ ඒ මත ක්‍රියා කිරීම හෝ ක්‍රියා කිරීමට අපොහොසත් වීම හෝ අන්‍යාකාර හේතුවක් හේතුවෙන් හෝ එවැනි හේතු සම්බන්ධයෙන් උපචිත වන සෘජු, වක්‍ර හෝ ආනුෂංගික පාඩු සම්බන්ධයෙන් කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ බැංකුව ගිණුම්හිමියා වෙත වගකියනු නොලබන අතර බැංකුව විසින් දුරකථන උපදෙස් පිළිගැනීම හෝ ඒ මත ක්‍රියා කිරීම හෝ ක්‍රියා කිරීමට නොහැකි වීම තුළින් හෝ ඒ සම්බන්ධයෙන් සෘජුව හෝ වක්‍රව උපචිත වන සියලුම නඩු, නඩු කටයුතු, හිමිකම්පෑම්, පාඩු, අලාභ, පිරිවැය සහ වියදම්වලට එරෙහිව ගිණුම්හිමියා විසින් සියලු අවස්ථාවලදී බැංකුව හානිපූරණයකර නිදහස්ව තබනු ලැබිය යුතුය. කාගිල්ස් බැංකුව සමඟ බැංකු සේවා පවත්වාගෙන යෑම අවසන් වුවද එය නොසලකා හරිමින් මෙම හානිපූරණය අඛණ්ඩව පැවතිය යුතුය.

6.3 මෙහි සඳහන් නියම සහ කොන්දේසිවලට අනුව දුරකථන උපදෙස් ලබාදීම සඳහාවූ ගිණුම්හිමියාගේ අයිතිය සියලු අවස්ථාවලදී බැංකුවේ අභිමතයට යටත්ව පවතින අතර බැංකුව විසින් පූර්ව නිවේදනයකින් තොරව ඕනෑම අවස්ථාවකදී

එම අයිතිය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකිය.

6.4 දුරකථන හෝ වෙනත් උපදෙස් ලබාදීමේ කාර්යය සඳහා ගිණුම්හිමියාගේ ගිණුමේ ප්‍රමාණවත් මුදල් (හෝ කලින් සැලසුම් කළ බැරකම් පහසුකම්) පවතින බවට ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් සහතික කරනු ලැබිය යුතු අතර, එසේ ක්‍රියා කිරීමට අපොහොසත් වීම හේතුවෙන් උපචිත වන ප්‍රතිවිපාක සම්බන්ධයෙන් බැංකුව වගකීමට යටත් නොවන නමුත් එසේ ප්‍රමාණවත් මුදල් නොමැති වීම පිළිබඳ නොසලකා හරිමින් එම උපදෙස් ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි තීරණය කර ඇති අවස්ථාවකදී, ගිණුම්හිමියගෙන්/ ගිණුම්හිමියන්ගෙන් පූර්ව අවසරයක් ලබා ගැනීමෙන් තොරව හෝ ගිණුම්හිමියා/ගිණුම්හිමියන් වෙත දැන්වීමෙන් තොරව බැංකුව විසින් එසේ ක්‍රියා කරනු ලැබිය හැකි අතර ඒ අනුව උපචිත විය හැකි අයිරා මුදල්, අත්තිකාරම් හෝ බැරකම් සම්බන්ධයෙන් සහ සියලු ආශ්‍රිත ගාස්තු සම්බන්ධයෙන් ගිණුම්හිමියා/ගිණුම්හිමියන් වගකියනු ලැබිය යුතුය. අයිරා මුදල්, අත්තිකාරම් හෝ බැරකම් බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි තීරණය කරනු ලබන පොලී අනුපාතික සඳහා යටත් වන අතර එකී අයිරා මුදල්, අත්තිකාරම් හෝ බැරකම් ගිණුම් සඳහා අදාල වන බැංකුවේ සාමාන්‍ය නියම හා කොන්දේසි මගින් පාලනය වන්නේය.

6.5 ඇමතුම් මධ්‍යස්ථානය හරහා සපයනු ලබන සේවා සඳහා බැංකුව විසින් දැනට පවත්නා ගාස්තු අය කරනු ලැබේ.

6.6 ඇමතුම්කරුගේ සත්‍යභාවය පිළිබඳ තහවුරු කරගැනීම සඳහා බැංකුව විසින් සාධාරණ පියවර ගනු ලැබිය යුතු නමුත් දුරකථනය හරහා ලැබෙන එවැනි ඉල්ලීම් අනුව බැංකුව විසින් සද්භාවයෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සඳහා බැංකුව කිසිදු ආකාරයකින් ගිණුම්හිමියා/ගිණුම්හිමියන් හෝ වෙනත් යම් පාර්ශවයක් වෙත වගකියනු නොලැබිය යුතු අතර බරපතළ අතපසු කිරීම සම්බන්ධයෙන් බැංකුව වරදකරුවකු නොවන්නේය.

6.7 යම් පාර්ශවයක් විසින් බැංකුවට එරෙහිව ගෙන එනු ලැබිය හැකි සියලුම නඩු, නඩු කටයුතු, හිමිකම්පෑම්, අලාභ, පිරිවැය සහ වියදම්වලට එරෙහිව හෝ බැංකු විසින් එම තොරතුරු සැපයීම මගින් ඍජුව හෝ වක්‍රව සිදුකරන ලද යම් ක්‍රියාවක්, කාරණයක් හෝ දෙයක් හේතුවෙන් බැංකුව විසින් විඳිනු ලබන සියලු නඩු, නඩු කටයුතු, හිමිකම්පෑම්, පාඩු, අලාභ, පිරිවැය සහ වියදම්වලට එරෙහිව

සියලු අවස්ථාවලදී බැංකුව හානිපූරණය කර නිදහස්ව තැබීම සඳහා ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් එකඟව පොරොන්දු වී සිටිනු ලැබේ.

6.8 බැංකුව විසින් ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් වෙත සහ/හෝ ඇමතුම්කරු වෙත ලබා දුන් තොරතුරු සම්බන්ධයෙන් බැංකුවට එරෙහිව ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් කිසිදු හිමිකම්පෑමක් සිදු කළ නොහැකි බවට හෝ එවැනි තොරතුරු මත බැංකුව විසින් සද්භාවයෙන් ක්‍රියා කිරීම හේතුවෙන් ගිණුම්හිමියා/ගිණුම්හිමියන් වෙත ඕනෑම ආකාරයකින් සෘජුව හෝ වක්‍රව උපචිත වන යම් පාඩු හෝ අලාභ සම්බන්ධයෙන් ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් කිසිදු හිමිකම්පෑමක් සිදු කළ නොහැකි බවට සහ එසේ බැංකුව විසින් ක්‍රියා කිරීම මගින් බරපතල පැහැරහැරීම් වරදක් සංයුක්ත නොවන බව ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් පිළිගෙන සිටිනු ලැබේ. ඇමතුම් මධ්‍යස්ථාන සේවය අවසන් වීම නොසලකා හරිමින් මෙම හානිපූරණය අඛණ්ඩව පවතියි.

## 7. බදු මුදල්.

7.1 සියලුම ගිණුම්හිමියන් විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ආකාරයට ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍රයෙහි ස්වකීය බදු තත්ත්වය සහ නේවාසික තත්ත්වය පිළිබඳව වූ ව්‍යවස්ථාපිත ප්‍රකාශනය සම්පූර්ණ කරනු ලැබිය යුතු අතර ස්වකීය ව්‍යවස්ථාපිත ප්‍රකාශයන් සහ බදු තත්ත්වයන් කාලීන ආකාරයකින් සම්පූර්ණ කරනු ලබන බවට සහතිකවීම ගිණුම්හිමියාගේ වගකීම වන්නේය. ගිණුම්හිමියා විසින් ස්වකීය බදු තත්ත්වය පිළිබඳ කාලීන ආකාරයෙන් ප්‍රකාශ කිරීමට අපොහොසත්වීම ඇතුළුව ගිණුම්හිමියා විසින් මුහුණ දී සිටින ඔහුගේ/ ඇයගේ බදු සම්බන්ධතා පිළිබඳව බැංකුව කිසිදු වගකීමක් භාර ගෙන සිටිනු නොලැබේ. ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් සිදුකරනු ලබන ව්‍යවස්ථාපිත ප්‍රකාශය එකම බලය පැවරීමක් මගින් විවෘත කරනු ලබන සහ පාලනය වන සියලුම පවත්නා සහ අලුත් ගිණුම් සඳහා අදාළ වන්නේය. පොළී ගෙවීම් මත ගෙවනු ලැබිය යුතු රඳවුම් බද්ද හෝ වෙනත් යම් බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් කලින් කල නිශ්චිතව දක්වනු ලබන (යම් අනුපාතිකයක් හෝ අනුපාතික යටතේ) අදාළ කාලසීමාව සඳහා ගෙවිය යුතු පොළී මුදලින් බැංකුව විසින් අඩු කරනු ලැබේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පසුව අයකරනු ලැබුවාවූ බැංකුව විසින් එකතු නොකරන ලද යම් රඳවුම් බදු මුදල් ඇත්නම් එසේ ගිණුම්හිමියාගේ/ ගිණුම්හිමියන්ගෙන් එකතුකර ගනු නොලැබූ රඳවුම් බදු මුදල් ගිණුම් හිමියා/ ගිණුම්හිමියන් වෙත නිවේදනය

කිරීමෙන් තොරව එසේ ගිණුම්හිමියාගෙන්/ගිණුම් හිමියන්ගෙන් ආපසු අයකර ගැනීම සඳහා බැංකුවට අයිතියක් ඇත්තේය.

## 8. බදු අනුකූලතාවය.

8.1 වගකීම් උපචිතවන සියලු අධිකරණ කලාපවලදී (බදු ගෙවීම් හෝ සියලු අදාළ බදු ගෙවීම් හා සම්බන්ධ වාර්තා සම්පූර්ණ කිරීම හෝ වෙනත් නියමිත ලිපි ලේඛන සම්පූර්ණ කිරීම ඇතුළුව) ඔබගේ බදු වගකීම් අවබෝධකර ගැනීම සහ එම බදු වගකීම්වලට අනුකූලව ක්‍රියා කිරීම සම්බන්ධයෙන් හෝ අප විසින් සපයනු ලබන ගිණුම (ගිණුම්) හෝ සේවා විවෘත කිරීම හෝ භාවිතයට අදාල ඔබගේ බදු වගකීම් අවබෝධ කර ගැනීම සහ එම බදු වගකීම්වලට අනුකූලව ක්‍රියා කිරීම සම්බන්ධයෙන් ඔබ පරම වශයෙන් වගකිව යුතු බවට ඔබ විසින් පිළිගෙන සිටිනු ලැබේ. සම්බන්ධිත තැනැත්තකු වශයෙන් ස්වකීය තත්ත්වයෙන් ක්‍රියා කරනු ලබන (ඔහුගේ පුද්ගලික තත්ත්වයෙන් නොව) එක් එක් සම්බන්ධිත තැනැත්තා තමා වෙනුවෙන්ම එවැනිම එකඟතාවයක් පළ කර සිටිනු ලැබේ. සම්බන්ධිත තැනැත්තෙකුගේ හෝ ඔබගේ පදිංචි ස්ථානය, නිවස, පුරවැසිභාවය හෝ සංස්ථාගත කිරීම පිළිබඳ සලකා නොබලමින්, ඇතැම් රටවලට අතිරේක ප්‍රාදේශීය බලපෑම් සහිතව බදු නීති පැනවීම් තිබිය හැකිය. **කාගිල්ස් බැංකුව** වන අප විසින් බදු උපදෙස් සපයනු නොලැබේ. ඔබට ස්වාධීන නීති සහ බදු උපදෙස් ලබාගන්නා ලෙස අප විසින් දන්වා සිටිනු ලැබේ. විශේෂයෙන්ම ගිණුම (ගිණුම්) විවෘත කිරීම සහ භාවිතය සම්බන්ධයෙන් සහ අප විසින් සපයනු ලබන සේවා භාවිතය සම්බන්ධයෙන් ඇතුළු වෙනත් කරුණු සම්බන්ධයෙන් ඕනෑම අධිකරණ බල ප්‍රදේශයක උපචිත විය හැකි ඔබගේ බදු වගකීම් සම්බන්ධයෙන් අප විසින් කිසිදු වගකීමක් දරනු නොලැබේ.

## 9. පාලන නීතිය සහ අධිකරණ බල ප්‍රදේශ.

9.1 මෙම නියම සහ කොන්දේසි ශ්‍රී ලංකාවේ නීතියට අනුව තේරුම් ගනු ලැබිය යුතු මෙන්ම ඒ අනුව බලාත්මක වන අතර ශ්‍රී ලංකාවේ අධිකරණ වෙත නඩු කටයුතු ඉදිරිපත් කරනු ලැබිය යුතු නමුත් බැංකුව විසින් යෝග්‍ය බවට තීරණය කරනු ලබන අවස්ථාවලදී වෙනත් යම් රටක හෝ අධිකරණ බල ප්‍රදේශයක අධිකරණ වෙත නඩු කටයුතු ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර එවැනි අවස්ථාවකදී එම අධිකරණවලට අදාළවන නීති ඉහතකී නඩු කටයුතු සඳහා අදාල කරගනු ලබන අතර ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් එම වෙනත් අධිකරණ වෙත නඩු කටයුතු

ඉදිරිපත් කිරීමට එකඟ විය යුතු අතර දරනු ලබන නෛතික ගාස්තු, අධිකරණ ගාස්තු සහ නීතිඥ ගාස්තු ගිණුම්හිමියාගේ/ ගිණුම්හිමියන්ගේ ණයගැති භාවයට එකතු කරනු ලැබිය යුතුය.

## 10. වෙනත් සාමාන්‍ය වගන්ති.

10.1 භාර විසින් විවෘත කරනු ලබන ගිණුම් සම්බන්ධයෙන් අතිරේක නියම හා කොන්දේසි අදාළ විය හැකිය.

10.2 නියාමකවරුන් විසින් මුදල් ආපසු ගැනීම් සහ පොලී ගෙවීම් මත යම් සීමා කිරීම් පනවනු ලබන අවස්ථාවකදී, ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් එම සීමාකිරීම් මගින් බැඳී සිටිය යුතුය.

10.3 ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් බැංකුව වෙත ලබා ලබාදී ඇති සියලුම විස්තර (ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍රයේ හෝ අන්‍යාකාරයකින් ලබා දී ඇති) ගිණුම්හිමියාගේ/ ගිණුම්හිමියන්ගේ දැනීම අනුව සත්‍ය හා නිවැරදි බවට ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් සහතිකකර සිටිනු ලැබේ. එම තොරතුරුවල යම් වෙනස්කමක් සිදු වුවහොත් ඒ පිළිබඳ වහාම බැංකුව වෙත දැනුම්දීම සඳහා ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් එකගව සිටිනු ලැබේ.

10.4 ලිපි හුවමාරු කාර්ය සඳහා බැංකුව වෙත සන්නිවේදනය කර ඇති ගිණුම්හිමියාගේ/ ගිණුම්හිමියන්ගේ ලිපිනය සහ වෙනත් සම්බන්ධවීමේ විස්තර (දුරකථන අංකය, විද්‍යුත් ලිපිනය ආදිය) වෙනස් වුවහොත් ඒ පිළිබඳව වහාම ලිඛිතව බැංකුව වෙත දැනුම්දිය යුතුය.

10.5 මේ යටතේ ගිණුම්හිමියා/ගිණුම්හිමියන් වෙත යොමු කරන ලද යම් නිවේදනයක් ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් බැංකුව වෙත ලිඛිතව අවසන්වරට දැනුම්දී ඇති ලිපිනය වෙත තැපැල් කිරීමේ දින සිට දින 7 ක කාලයක් ඇතුළත ගිණුම්හිමියා/ගිණුම්හිමියන් වෙත ලැබී ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

### 10.6 හවුල් ගිණුම්.

10.6.1 යම් ගණුදෙනුකාර ගිණුමක් හවුල් ගිණුමක් වන අවස්ථාවකදී, සියලු පොලී මුදල්, කොමිස් මුදල් සහ වෙනත් බැංකු ගාස්තු සහ වියදම් සමග එවැනි ගිණුමක් සඳහා

ප්‍රදානය කරනු ලබන අයිරා පහසුකම්, ණය මුදල් හෝ වෙනත් බැරකම් පහසුකම් හෝ මූල්‍ය පහසුකම් සම්බන්ධයෙන් සියලුම හවුල් ගිණුම්හිමියන් ඒකාබද්ධව සහ වෙන් වෙන්ව වගකියනු ලැබිය යුතුය.

### 10.6.2 ගණුදෙනුකරු මියගොස් ඇති අවස්ථාවක කාර්යපටිපාටිය.

යම් හවුල් ගිණුමක හවුල් ගිණුම්හිමියන් හෝ යම් හවුල් ගිණුම්හිමියකු මිය ගොස් ඇති අවස්ථාවකදී, අවශ්‍ය අවස්ථාවලදී ගණුදෙනුකරුගේ හවුල් ගිණුමේ ඇති හෝ ගිණුම්වල ඕනෑම ආකාරයකින් බැරට පවතින හෝ බැංකුව විසින් දරනු ලබන (ඇප තැන්පතු පෙට්ටි සහ වෙනත් අඩංගු ද්‍රව්‍ය ඇතුළු) සියලු මුදල්, ඇප ඔප්පු, ලිපි ලේඛන සහ වෙනත් දේපළ බැංකුව විසින් ගණුදෙනුකරුගේ ජීවත්ව සිටින තැනැත්තා හෝ තැනැත්තන් වෙත නැතහොත් එම ජීවත්ව සිටින තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ නියමය පරිදි ගෙවීම හෝ භාරදීම සිදුකරනු ලැබිය යුතුය.

### 10.6.3 නිවේදන

නිවේදන අවශ්‍ය අවස්ථාවලදී හවුල් ගිණුම්හිමියන්ගේ ලැයිස්තුවේ පළමුව නම් සඳහන් ගිණුම්හිමියා වෙත යවනු ලැබිය යුතුය.

## 11. බැංකු සේවා පිරිවැය.

### 11.1 පොළිය, ගාස්තු සහ පසුව පියවනු ලබන වියදම්.

### 11.1.1 පොළිය සහ ගාස්තු.

බැංකුව සමග ගණුදෙනුකරු විසින් කලින් කල ලිඛිතව එකඟවී ඇති යම් පොලී අනුපාතිකයක් (අනුපාතික) මත යම් පදනමක් හෝ පාදක මත සහ යම් අවස්ථාවකදී (අවස්ථාවලදී) හෝ එවැනි ලිඛිත ගිවිසුමක් නොමැති අවස්ථාවකදී, බැංකුව විසින් තීරණය කරනු ලබන ආකාරයෙන් ගණුදෙනුකරු විසින් බැංකුව වෙත ගෙවිය යුතු මුදල් මත ගණුදෙනුකරු විසින් පොළිය ගෙවනු ලැබිය යුතුය; ගණුදෙනුකරු විසින් ගෙවීමට නියමිත වේ නම් එසේ ගෙවීමට නියමිත වන පොලී අනුපාතික, ගාස්තු සහ කොමිස් මුදල් ඇතුළුව බැංකුවේ පොදු ගාස්තු

පිළිබඳ විස්තර බැංකු ශාඛාවෙන් ලබා ගත හැකි මෙන්ම අපගේ වෙබ් අඩවියේ පවතින බැංකුවේ ගාස්තු සටහනෙහි අන්තර්ගත වේ.

**ගණනය කිරීමේ ක්‍රමවේදය.**

බැංකු පොළිය ගණනය කිරීමේ සූත්‍රය පහත දැක්වෙන පරිදි වේ. එය බැංකුවේ සමස්ත වත්කම් සහ වගකීම් සේවා සමග අනුකූල වේ. මෙම සූත්‍රය බැංකුවේ පරම අභිමතය පරිදි කලින් කල වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම කරනු ලැබිය හැකිය.

ශේෂ පාදකය* පොලී අනුපාතිකය/100* පොලී පදනම.

සටහන: පොළී පදනම ව්‍යවහාර මුදල් මත රඳා පවතියි. උදාහරණයක් ලෙස, ශ්‍රී. ල. රුපියල ස්ථාවර වේ./ ස්ථාවර, එ.ජ.ඩො. ස්ථාවර වේ/360.

## 11.1.2 හිඟ මුදල් මත පොළිය.

අය විය යුතු අවස්ථාවලදී ගෙවා නොමැති මුදල් මත හෝ පූර්ව වැඩ පිළිවෙලකින් තොරව වැඩිපුර ලබාගෙන ඇති මුදල් මත බැංකුවේ අභිමතය පරිදි ඉහළ පොලී අනුපාතිකයක් යටතේ පොළිය අය කිරීම සඳහා බැංකුවට හිමිකමක් පවතින අතර එම පොළිය බැංකුව විසින් තීරණය කරනු ලබන ආකාරයට කාලීනව ඒකාබද්ධ කරනු ලැබිය හැකිය.

## 11.1.3 වෙනස්වන පොළිය සහ ගාස්තු.

පොලී අනුපාතිකය වෙනස්වන ණය මුදල් සම්බන්ධයෙන් වන විට, පිළිවෙලින්වූ ගිවිසුමේ නියමයන් ප්‍රකාරව පොලී අනුපාතිකය ගළපනු ලැබේ. අනාකාරයකින් එකඟ වී ඇත්නම් මිස සේවා සඳහා වූ ගාස්තු බැංකුවේ සාධාරණ අභිමතය පරිදි බැංකුව විසින් වෙනස් කරනු ලැබිය හැකිය.

## 11.4 පිරිවැය සහ වියදම්.

ගණුදෙනුකරුට කලින් දන්වන ලද හෝ එසේ දන්වනු නොලැබූ බැංකුව විසින්

සාමාන්‍යයෙන් අයකරනු ලබන සියලු කොමිස් මුදල් සහ වෙනස් ගාස්තු සහ මෙම සාමාන්‍ය කොන්දේසිවලට අදාලවන නෛතික ගාස්තුද ඇතුලුව බැංකුව සහ ගණුදෙනුකරු අතර පවතින යම් විශේෂිත කොන්දේසි හෝ වෙනත් ගිවිසුම්වලට අදාළව බැංකුව විසින් දරන ලද වෙනත් සියලු පිරිවැය, ගාස්තු සහ පසුව පියවනු ලබන වියදම් සහ වෙනත් වියදම් ඉල්ලා සිටීමේදී ගණුදෙනුකරු විසින් වහාම බැංකුව වෙත ගෙවීම හෝ ප්‍රතිපූරණය කිරීම කරනු ලැබිය යුතු අතර එම සියලු දේ ගණුදෙනුකරුගේ ගිණුමෙන් (ගිණුම්වලින්) හරකර ගැනීම සඳහා බැංකුවට හිමිකමක් ඇත්තේය.

**11.1.5 බදු සහ වෙනත් ගාස්තු.**

බැංකුව විසින් ගණුදෙනුකරු සමග පවත්වාගෙන යනු ලබන ගණුදෙනු සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලු ව්‍යවස්ථාපිත ගාස්තු, මුද්දර ගාස්තු සහ වෙනත් අයකිරීම් ගණුදෙනුකරු විසින් බැංකුව වෙත ප්‍රතිපූරණය කිරීමට ද බැඳී සිටිනු ලැබේ.

11.2 බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි යෝග්‍ය බවට තීරණය කරනු ලබන ආකාරයට කලින් කළ සේවා ගාස්තු සහ/හෝ වෙනත් ගාස්තු පැනවීම සඳහා බැංකුව විසින් අයිතිය තබාගනු ලැබේ.

11.3 පූර්ව නිවේදනයකින් තොරව, බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි කලින් කළ යෝග්‍ය බවට තීරණය කරන ආකාරයට මෙහි සඳහන් සේවා, ගාස්තු සහ යම් නියම හා කොන්දේසි සඳහා අලුතින් යමක් එකතු කිරීම, ඉවත් කිරීම හෝ වෙනස් කිරීම සඳහා බැංකුව විසින් අයිතිය තබාගනු ලැබේ. බැංකුවේ ගාස්තු අයකිරීම් සටහන බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.cargillsbank.com යන වෙබ් අඩවියෙන් සහ/හෝ ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් ඉල්ලීමක් කිරීමෙන් පසුව බැංකුවේ ශාඛා කාර්යාලයෙන් සහ/හෝ බැංකු ප්‍රකාශන පණිවුඩ හරහා ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් ලබාගත හැකි අතර එසේ ලබාගන්නා ගාස්තු අයකිරීම් සටහන මගින් ගිණුම්හිමියා/ගිණුම්හිමියන් වෙත එකී තොරතුරු පිළිබඳ නිවේදනයක් ලබාදී ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

## 12. දත්ත රඳවා තබා ගැනීම සහ ගබඩා කිරීම.

බැංකුව විසින් බැංකු ප්‍රකාශනවල, වවුචර්වල, මුදල් ආපසු ගැනීම්/ මුදල් තැන්පත්

කිරීමේ පත්‍රිකාවල, චෙක්පත්වල හෝ ගිණුම්වල සඳහන් වෙනත් යම් ගණුදෙනු වාර්තාවල පිටපත් බැංකුව විසින් නියම කරනු ලබන කාලසීමාවක් සඳහා රඳවාගෙන තබනු ලැබේ. එම නියම කරන ලද කාලසීමාවෙන් පසුව එවැනි සියලු වාර්තා විනාශ කරනු ලබන අතර එකී කාලසීමාවෙන් පසුව බැංකු ප්‍රකාශවල හෝ ගණුදෙනු වාර්තාවල පිටපත් සැපයීම සම්බන්ධයෙන් බැංකුව විසින් කිසිදු වගකීමක් හෝ බැඳී සිටීමක් භාර ගෙන සිටිනු නොලැබේ.

ගිණුම්හිමියාට/ගිණුම්හිමියන්ට අදාළ ගිණුම් තොරතුරු ඇතුළු සියලුම දත්ත පහත සඳහන් තැනැත්තන් විසින් සම්ප්‍රේෂණය කරනු ලැබිය හැකි සහ/හෝ ගබඩා කරනු ලැබිය හැකි සහ/හෝ යම් ස්ථානයක තබනු ලැබිය හැකි මෙන්ම එම තැනැත්තන් විසින් එම දත්ත වෙත ප්‍රවේශ විය හැකි බව ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් එකඟවී පිළිගෙන සිටිනු ලැබේ.:- එනම් -

12.1.1 බැංකුවේ, එහි ප්‍රධාන කාර්යාලයේ, බැංකු ශාඛා කාර්යාලවල යම් බලයලත් තැනැත්තකු;

12.1.2 යම් දත්ත සැකසුම් සේවා සපයන්නකු;

12.1.3 ප්‍රකාශන මුද්‍රණය කිරීම හා තැන්පත් කිරීම සඳහා බැංකුව විසින් සේවයේ යොදවා ඇති යම් තැනැත්තකු;

12.1.4 බැංකුව විසින් අවශ්‍ය බවට සලකනු ලබන යම් තැනැත්තකු;

12.1.5 පරිපාලන සහ අභ්‍යන්තර නියාමන අවශ්‍යතා ඇතුළු යම් කාර්ය සඳහා බැංකුවේ අදහස අනුව එම සම්ප්‍රේෂණය, ගබඩා කිරීම සහ/හෝ ප්‍රවේශවීම අවශ්‍යවන අවස්ථාවකදී, ලියුම් කවර තුළට බහාලීම්, ප්‍රකාශන මුද්‍රණය සහ තැපැල් කිරීම හෝ එයට සමාන සේවා සැපයීම ඇතුළු එවැනි ව්‍යාපාරික සේවා බැහැරින් ලබා ගන්නා සාමාන්‍ය කාලසීමාව තුළදී බැංකුව විසින් අවශ්‍ය බවට සලකනු ලබන යම් තැනැත්තකු.

## 13. උපදෙස් මත ක්‍රියා කිරීම.

ගිණුම්හිමියාගෙන්/ ගිණුම්හිමියන්ගෙන් වැඩකරන කාලසීමාව තුළදී බැංකු ශාඛා වෙත තැපැල් මගින් හෝ අතින් භාර දීම මගින් ලැබෙන (ස්ථාවර උපදෙස්

ඇතුළු) ගිණුම් හර කිරීමෙන් ගණුදෙනු ක්‍රියාත්මක කිරීම සඳහා ලැබෙන බලයලත් ලිඛිත උපදෙස්මත පමණක් බැංකුව විසින් ක්‍රියා කරනු ලැබිය යුතුය. යම් නිශ්චිත කාලසීමාවක් ඇතුළත එම උපදෙස් මත ක්‍රියා කිරීමට බැංකුව අපොහොසත්වීම හේතුවෙන් උපචිතවන යම් හිමිකම්පෑම්, පාඩු හෝ පිරිවැය සම්බන්ධයෙන් බැංකුව වගකීමට යටත් නොවිය යුතු මෙන්ම බැඳී සිටිනු නොලැබිය යුතුය. මෙම ක්‍රමවේද භාවිත කරමින් ගණුදෙනු සිදු කිරීම සඳහා බැංකුව සහ ගිණුම්හිමියා/ගිණුම්හිමියන් අතර යම් නිශ්චිත ගිවිසුමක් නොමැතිව ෆැක්ස්මිලි, විද්‍යුත් තැපැල හෝ වෙනත් විද්‍යුත් ක්‍රමයක් හරහා ලැබෙන උපදෙස් බැංකුව විසින් පිලිගෙන සිටිනු නොලැබේ.

බැංකුවේ පරම අභිමතය පරිදි එසේ ක්‍රියාකරයි නම් මිස, මුදල් තැන්පතු, මුදල් ආපසු ගැනීම් හෝ චෙක්පත් මුදල් ආපසු ගැනීම්, චෙක්පත් තැන්පතු සහ වෙනත් යම් හරකිරීම්/ බැරකම් ගණුදෙනු සඳහා විද්‍යුත් තැපැල මගින් බැංකුව විසින් වෙනම ගණුදෙනුකාර උපදෙස් යවනු නොලැබිය යුතුය.

## 14. උපයෝගිතා බිල්පත් ගෙවීම්.

බැංකුව විසින් අදාළ උපයෝගීතා සමාගම වෙත නියමිත වේලාවට ගෙවීම් ක්‍රියාත්මකකර තිබියදී, පිළිවෙළින්වූ උපයෝගීතා සමාගම සමඟ පවත්වාගෙන යනු ලබන ගිණුම්හිමියාගේ ගිණුම බැරකිරීමේදී උපයෝගීතා සමාගමේ පාර්ශ්වයෙන් සිදුවන යම් ප්‍රමාදයක් සම්බන්ධයෙන් බැංකුව වගකියනු නොලැබේ.

## 15. මූල්‍ය ගණුදෙනු නියෝග.

බැංකුව විසින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම සහ සම්බාධකවලට යටත් විය හැකි යම් තැනැත්තන් හෝ ආස්ථිත්වවලට මූල්‍ය සහ වෙනත් සේවා සැපයීම යනාදියට අදාල බැංකුවට අදාළවන නීති ප්‍රකාරව ක්‍රියා කිරීමට නියමිත වේ. එම නිසා, එකී නීති සහ නියෝග ප්‍රකාරව බැංකුවේ පරම අභිමතය පරිදි ක්‍රියා කිරීමට උචිත බවට සලකනු ලබන යම් කටයුතු සිදුකිරීම සඳහා බැංකුවට හිමිකමක් ඇත්තේය. එවැනි ක්‍රියා සඳහා බැංකු පද්ධතිය හරහා ගිණුම්හිමියා විසින් හෝ ගිණුම්හිමියා වෙත හෝ ගිණුම්හිමියා වෙනුවෙන් යවන ලද යම් ගෙවීම් පණිවුඩයක් සහ වෙනත් තොරතුරක් හෝ සන්නිවේදනයක්

රඳවා තැබීම සහ ඒ පිළිබඳ විමර්ශනය කිරීම වැනි ඊට සීමා නොවන්නාවූ කටයුතු ඇතුළත් වන අතර නමක් මගින් සඳහන්වන සම්බාධක පනවන ලද තැනැත්තා හෝ ආස්ථිත්වය මගින් ඇත්ත වශයෙන්ම එම තැනැත්තා හෝ අස්ථිත්වය පිළිබඳ සඳහන් වේද යන්න පිළිබඳ තවදුරටත් විමර්ශන සිදු කිරීමද ඊට ඇතුලත් වේ. පහත සඳහන් හේතු මගින් උපචිතවන යම් පාර්ශවයක් විසින් දරන ලද (ඍජු හෝ ආනුෂංගික පාඩු සහ ලාභ අහිමිවීම හෝ පොළිය අහිමි වීම ඇතුළු ඊට සීමා නොවන්නාවූ) යම් පාඩු හෝ අලාභ සම්බන්ධයෙන් බැංකුව වගකියනු නොලැබේ;- එනම්,

15.1.1 එකී නීති සහ නියෝග ප්‍රකාරව කටයුතු කිරීම උචිතබවට බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි තීරණය කිරීමේදී බැංකුව විසින් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් යම් පියවර ගැනීම හේතුවෙන් ගිණුම් නියම හෝ වෙනත් යම් වගකීම් යටතේ ස්වකීය කාර්ය ඉටුකිරීමේදී බැංකුව මගින් සිදුවන යම් ප්‍රමාදයක් හෝ අපොහොසත් වීමක්; හෝ

15.1.2 මෙම වගන්තිය යටතේ බැංකුවේ යම් අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම. ඇතැම් අවස්ථානුගත කරුණු යටතේ, බැංකුව විසින් ගනු ලබන පියවර මගින් ඇතැම් තොරතුරු සකස්කිරීම වැළැක්වීමක් හෝ තොරතුරු සකස්කිරීමේ ප්‍රමාදයක් සිදුවිය හැකිය. එමනිසා, මෙම වගන්තියට අනුව ගන්නා ලද යම් පියවරක, විෂයවස්තුව වන්නාවූ යම් ගෙවීම් පණිවුඩ සහ සන්නිවේදනවලට අදාළව බැංකු පද්ධතියේ පවතින තොරතුරු, එම පියවර ගනු ලබන අතරතුරදී නිවැරදි, තත්කාලීන හෝ එම තොරතුරු වෙත ප්‍රවේශවන අවස්ථාවේදී යාවත්කාලීන බවට බැංකුව විසින් සහතිකකර සිටිනු නොලැබේ. යම් අදාළ නීති සහ නියෝගවල වඩා වැදගත් අවශ්‍යතාවලට යටත්ව හැකි සාධාරණ ප්‍රායෝගික ඉක්මණින් එවැනි අවස්ථානුගත කරුණු පැවතීම පිළිබඳව ගිණුම්හිමියා/ ගිණුම්හිමියන් වෙත දැනුම්දීම සඳහා බැංකුව විසින් සෑම උත්සාහයක්ම දරනු ලබන්නේය.

15.1.3 2006 අංක 6 දරණ මූල්‍ය ගණුදෙනු වාර්තාකිරීමේ පනත ප්‍රකාරව මූල්‍ය බුද්ධි ඒකකය (FIU) වෙත සැකකටයුතු ගණුදෙනු වාර්තා කිරීමට අදාළ රීති.

යම් නීති විරෝධී ක්‍රියාවක් හෝ වෙනත් අපරාධ වරදක් සිදුකිරීම සමග යම් ගණුදෙනුවක් හෝ උත්සාහ කරන ලද ගණුදෙනුවක් සම්බන්ධවන බවට විශ්වාස කිරීම සඳහා බැංකුව වෙත සාධාරණ හේතු පවතින අවස්ථාවකදී හෝ යම් තැනැත්තකු විසින්, පුද්ගල සමූහයක් විසින් හෝ යම් ආස්ථිත්වයක් විසින් හෝ

යම් විමර්ශනයකට නඩු පැවරීමකට අදාළව මුදල් විශුද්ධිකරණය හෝ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම ඇතුළුවූ යම් යෝජිත නීති විරෝධී ක්‍රියාවක් හෝ අපරාධ වරදකට අදාළ විය හැකි තොරතුරු බැංකුව සතුව පවතින අවස්ථාවකදී, ඒ පිළිබඳව බැංකුව විසින් වහාම මූල්‍ය බුද්ධි ඒකකය වෙත (FIU) වාර්තා කරනු ලැබිය යුතුය.

එම වාර්තාව FIU විසින් නියම කරනු ලබන ආකෘතියෙන් සකස් කරනු ලැබිය යුතු අතර එහි FIU විසින් නියම කරනු ලබන දත්ත ඇතුලත් විය යුතුය.

කිසිදු ගණුදෙනුවක් සිදු නොකරන ලෙස FIU විසින් බැංකුව වෙත විධාන කර ඇති අවස්ථාවකදී, අවශ්‍ය විමර්ෂන සිදුකර නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතනවල සහාය ලබා ගැනීමට FIU වෙත ඉඩ දීම පිණිස බැංකුව විසින් ගණුදෙනු අත්හිටුවනු ලැබිය යුතුය.

මෙම රීති යටතේ බැංකු විසින් ගනු ලබන කිසිදු පියවරක් පිළිබඳ දැනගැනීම සඳහා ගණුදෙනුකරුට හිමිකමක් නොමැති අතර බැංකු විසින් ගනු ලබන එවැනි පියවර සම්බන්ධයෙන් බැංකුව කිසිදු ආකාරයකින් ගණුදෙනුකරුට වගකියනු නොලැබිය යුතු හෝ වගකීමට යටත් නොවිය යුතුය.

2006 මූලික ගණුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාරව ඉහත සඳහන් ප්‍රවේශ ලක්ෂ ගණුදෙනු FIU වෙත වාර්තා කිරීම පිළිබඳ රීති.

නියෝග මගින් නිශ්චිතව දක්වා ඇති මුදල් ප්‍රමාණය ඉක්මවමින් සිදු කරනු ලබන සෑම මුදල් ගණුදෙනුවක් සහ ඉලෙක්ට්‍රොනික මුදල් පැවරීමක්ම පිළිබඳ FIU විසින් නියම කරනු ලබන ආකෘතියෙන් සහ එසේ නියම කරනු ලබන යම් කාලසීමාවක් ඇතුළත බැංකුව විසින් FIU වෙත වාර්තා කිරීමට නියමිත වේ.

වාර්තාකිරීම අවශ්‍යවන ඉලෙක්ට්‍රොනික මුදල් පැවරීම් සඳහා අභ්‍යන්තර සහ භාහිර ප්‍රේෂණ, SLIP පැවරීම්, CEFT පැවරීම්, RTGS ගණුදෙනු, ක්‍රෙඩිට් කාඩ්පත් ගණුදෙනු, ඩෙබිට් කාඩ්පත් ගණුදෙනු, (අදාළ වේ නම්) සහ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට අදාළ ගණුදෙනු ඇතුළු ඊට සීමා නොවන්නාවූ ඕනෑම ආකාරයකින් සිදු කරනු ලබන ඉලෙක්ට්‍රොනික මුදල් පැවරීම් ඇතුළත් වේ.

මෙම රීති යටතේ බැංකුව විසින් ගන්නා ලද යම් ක්‍රියාමාර්ගයක් සම්බන්ධයෙන් බැංකුව කිසිදු ආකාරයකින් ගණුදෙනුකරු වෙත වගකියනු නොලැබිය යුතු හෝ වගකීමට යටත් නොවිය යුතුය.

## 16. තොරතුරු හෙළිදරව් කිරීම.

16.1 ගිණුම්හිමියා/ගිණුම්හිමියන් වෙනුවෙන් බැංකුව විසින් ගණුදෙනු ක්‍රියාත්මක කරනු ලබන යම් නිසි බලය සහිත අධිකරණ කලාපයක් තුළ පවතින නීතිය, රීති හෝ නියෝග මගින් හෝ එවැනි අධිකරණ කලාපවල විනියමය ආයතනයක්, රාජ්‍ය හෝ නියාමන අධිකාරියක් මගින් බැංකුවෙන් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවකදී, ගිණුම්හිමියාට/ගිණුම්හිමියන්ට අදාළ ගිණුමට (ගිණුම්වලට) අදාල සහ/හෝ ගිණුම්හිමියා/ගිණුම්හිමියන් වෙනුවෙන් බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් ගණුදෙනුවක් (ගණුදෙනු) පිළිබඳ තොරතුරු යම් තැනැත්තකු (තැනැත්තන්) වෙත හෙළිදරව් කිරීම සඳහා සහ පැවරීම සඳහා ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් බැංකුව වෙත බලය පවරා සිටිනු ලැබේ.

16.2 කලින් කල ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයේ ගැසට් නිවේදනයක් මගින් පනවනු ලබන ප්‍රවේශ ලක්ෂය ඉක්මවමින් සිදු කරනු ලබන සියලුම තැන්පතු පිළිබඳව වාර්තා කිරීම සඳහා 2006 අංක 6 දරණ මූල්‍ය ගණුදෙනු වාර්තා කිරීමේ පනත මගින් බැංකුව බැඳී සිටියි.

## 17. ගණුදෙනුකරුවන්ගේ තොරතුරු රැස්කිරීම, සකස් කිරීම සහ හුවමාරු කර ගැනීම.

### 17.1 තොරතුරු රැස් කිරීම.

17.1.1 **කාගිල්ස් බැංකුව** විසින් ගණුදෙනුකරු පිළිබඳ තොරතුරු, ගණුදෙනුකරුගේ ගණුදෙනු කටයුතු පිළිබඳ තොරතුරු සහ ගණුදෙනුකරු විසින් **කාගිල්ස් බැංකුවේ** නිෂ්පාදන සහ සේවා භාවිතා කිරීම පිළිබඳ තොරතුරු ඇතුළුව ගණුදෙනුකාර තොරතුරු රැස්කිරීම, භාවිත කිරීම සහ හුවමාරු කිරීම කරනු ලැබිය හැකිය. ගණුදෙනුකාර තොරතුරු ගණුදෙනුකරුගෙන් (හෝ ගණුදෙනුකරු වෙනුවෙන් ක්‍රියා කරනු ලබන යම් තැනැත්තකුගෙන්) ඉල්ලා සිටිනු ලැබිය හැකි අතර **කාගිල්ස් බැංකුව** සමග පවතින වෙනත් තොරතුරු සමග උත්පාදනයවන හෝ

සංයුක්තවන (ප්‍රසිද්ධියේ පවතින තොරතුරුවලින් ඇතුළුව) වෙනත් මූලාශ්‍රවලින් **කාගිල්ස් බැංකුව** විසින් හෝ කාගිල්ස් බැංකුව වෙනුවෙන් එම ගණුදෙනුකාර තොරතුරු රැස් කර ගනු ලැබිය හැකිය.

## 17.2 දත්ත සකස් කිරීම.

17.2.1 **කාගිල්ස් බැංකුව** විසින් පහත සඳහන් අරමුණු සම්බන්ධයෙන් ගණුදෙනුකාර තොරතුරු සකස් කිරීම, පැවරීම සහ හෙළිදරව් කිරීම සිදු කරනු ලැබේ:-

(අ) සේවා සැපයීම සඳහා සහ ගණුදෙනුකරු විසින් ඉල්ලා සිටිනු ලබන හෝ බලය පවරනු ලබන යම් ගණුදෙනු සම්බන්ධයෙන්;

(ආ) අනුකූලව ක්‍රියා කිරීමේ බැඳීම් සපුරාලීම;

(ඇ) මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් පැවැත්වීම;

(ඈ) ගණුදෙනුකරුගෙන් අයවිය යුතු මුදල් ලබාගැනීම;

(ඉ) බැරකම් පරීක්ෂාවක් පැවැත්වීම සහ බැර යොමු සටහන් ලබා ගැනීම සහ සැපයීම;

(ඊ) **කාගිල්ස් බැංකුවේ** සුභසිද්ධිය බලාත්මක කිරීම හෝ ආරක්ෂා කිරීම;

(උ) **කාගිල්ස් බැංකුවේ** අභ්‍යන්තර මෙහෙයුම් අවශ්‍යතා සම්බන්ධයෙන් (බැරකම් සහ අවදානම් කළමනාකරණය, පද්ධති හෝ නිෂ්පාදන ප්‍රවර්ධනය සහ සැලසුම් කිරීම්, රක්ෂණ, විගණන සහ පරිපාලන කාර්ය ඇතුළු ඊට සීමා නොවන්නාවූ කරුණු);

(ඌ) (ගණුදෙනුකරුවෙත සහ වෙළඳපල පර්යේෂණ සඳහා මූල්‍ය සේවා හෝ ආශ්‍රිත නිෂ්පාදන අලෙවිකරණය කිරීම හෝ ප්‍රවර්ධනය කිරීම ඇතුළු) ගණුදෙනුකරු සමග පවතින **කාගිල්ස් බැංකුවේ** සමස්ථ සම්බන්ධතාවය පවත්වාගෙන යෑම (''අරමුණු'')

## 17.3 තොරතුරු හුවමාරුකර ගැනීම.

17.3.1 සේවාවන් භාවිත කිරීම මගින් **කාගිල්ස් බැංකුව** විසින් (තත්කාර්ය සඳහා අවශ්‍යවන සහ උචිතවන) යම් ගණුදෙනුකාර තොරතුරු පහත සඳහන් ග්‍රාහකයන් වෙත පැවරීම සහ හෙළිදරව් කිරීම සිදුකල හැකි බවට ගණුදෙනුකරු එකඟව සිටිනු ලැබේ:- (එම ග්‍රාහකයන් විසින්ද යම් කාර්ය සඳහා එකී ගණුදෙනුකාර තොරතුරු සකස් කිරීම, පැවරීම සහ හෙළිදරව් කිරීම කරනු ලැබිය හැකිය):-

(අ) (ස්වකීය සේවා නියුක්තිකයන්, අධ්‍යක්ෂකවරුන් සහ නිලධරයන් ඇතුළු) **කාගිල්ස් බැංකුවේ** යම් උපකොන්ත්‍රාත්කරුවන්, නියෝජිතවරුන්, සේවා සපයන්නන් හෝ ආශ්‍රිතයන්;

(ආ) යම් අධිකාරියකින් ලැබෙන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීමක් වශයෙන්;

(ඇ) ගණුදෙනුකරු වෙනුවෙන් ක්‍රියා කරනු ලබන යම් තැනැත්තකු, ගෙවීම් ග්‍රාහකයන්, අර්ථලාභීන්, ගිණුම් නාමිකයන්, අතරමැදි, සම්බන්ධතා සහ නියෝජිත බැංකු, නිශ්කාශන මධ්‍යස්ථාන, නිශ්කාශන හෝ ගෙවා නිරාකරණය කිරීමේ පද්ධති, වෙළඳපල ප්‍රතිපාර්ශව, ප්‍රතිගාමී රැඳවුම් නියෝජිතවරුන්, හුවමාරු හෝ වෙළඳ තැන්පතුගාර, කොටස් හුවමාරු, ගණුදෙනුකරුට සුරැකුම්පත්වල සම්බන්ධතාවක් සහිත සමාගම් (එම සුරැකුම්පත් ගණුදෙනුකරු වෙනුවෙන් **කාගිල්ස් බැංකුව** විසින් දරනු ලබන අවස්ථාවකදී;)

(ඈ) සේවාවලදී හෝ සේවා සම්බන්ධයෙන් යම් සම්බන්ධතාවක් අත්කරගෙන සිටින හෝ අවදානමක් භාරගෙන සිටින යම් පාර්ශවයක්;

(ඉ) වෙනත් යම් මූල්‍ය ආයතන, ණය යොමු කිරීමේ නියෝජිත ආයතන හෝ ණය තොරතුරු කාර්යාංශ, ණය යොමු සටහන් ලබා ගැනීම හෝ සැපයීම සඳහා, විගණකවරුන්/ බදු උපදේශකවරුන්;

(ඊ) ගණුදෙනුකරුවෙත වත්කම් කළමනාකරණ සේවා සපයනු ලබන යම් තුන්වන පාර්ශව අරමුදල් කළමනාකරුවකු;

(උ) **කාගිල්ස් බැංකුව** විසින් හඳුන්වාදීම් හෝ යොමු කිරීම් සිදුකරනු ලබන යම් හඳුන්වාදීමේ තැරැව්කරුවකු;

(ඌ) සේවා සපයනු ලබන කලාපයේ මෙන් සමාන මට්ටමේ ආරක්ෂාවක් සපයනු ලබන දත්ත ආරක්ෂණ නීති නොමැතිවූ බල ප්‍රදේශද ඇතුළුව ඕනෑම ස්ථානයක පිහිටා ඇති **කාගිල්ස් බැංකුවේ** ව්‍යාපාර පැවරීම්, බැහැර කිරීම්, ඒකාබද්ධ කිරීම් හෝ අත්කර ගැනීම සම්බන්ධයෙන්;

## 17.4 ගණුදෙනුකරුගේ වගකීම්.

17.4.1 **කාගිල්ස් බැංකුව** වෙත සපයන ලද ගණුදෙනුකරු පිළිබඳ විස්තර කලින් කල වෙනස් වූවහොත් වහාම සහ ඕනෑම අවස්ථාවකදී දින 30ක කාලයක් ඇතුළත ඒ පිළිබඳව කාගිල්ස් බැංකුව වෙත දැනුම් දෙනු ලබන බවට සහ **කාගිල්ස් බැංකුවෙන්** ලැබෙන ඉල්ලීම් සඳහා වහාම ප්‍රතිචාර දක්වනු ලබන බවට ගණුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

17.5 (පුද්ගලික දත්ත හෝ බදු තොරතුරු ඇතුළු) ස්වකීය තොරතුරු **කාගිල්ස් බැංකුව** වෙත සපයා ඇත්තාවූ සෑම සම්බන්ධිත තැනැත්තකු/තැනැත්තන් විසින් මෙම නියම හා කොන්දේසිවල නිශ්චිතව දක්වා ඇති පරිදි ස්වකීය තොරතුරු සකස් කිරීම, හෙළිදරව් කිරීම සහ පැවරීම සඳහා එකඟ වී ඇති බව ගණුදෙනුකරු විසින් තහවුරු කර සිටිනු ලැබේ. ස්වකීය පුද්ගලික දත්ත වෙත ප්‍රවේශ වීම සඳහා සහ එම දත්ත නිවැරදි කිරීම සඳහා සම්බන්ධිත තැනැත්තන්ට/ එම වෙනත් තැනැත්තන්ට අයිතියක් ඇති බව ගණුදෙනුකරු විසින් එකී සම්බන්ධිත තැනැත්තන් වෙත/ එම වෙනත් තැනැත්තන් වෙත දැනුම් දිය යුතුය.

17.6 පහත සඳහන් අවස්ථාවලදී, එනම්-

17.6.1 **කාගිල්ස් බැංකුව** විසින් සාධාරණ ලෙස ඉල්ලා සිටිනු ලබන ගණුදෙනුකාර තොරතුරු සැපයීම යම් ගණුදෙනුකරුවකු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවකදී; හෝ

17.6.2 යම් කාර්ය සඳහා ගණුදෙනුකාර තොරතුරු සකස් කිරීමට, පැවරීමට හෝ හෙළිදරව් කිරීමට **කාගිල්ස් බැංකුවට** අවශ්‍යවන අවස්ථාවලදී එම තොරතුරු ලබා දීම සඳහාවූ කැමැත්ත යම් ගණුදෙනුකරුවකු විසින් රඳවා තබාගෙන සිටිනු ලබන

හෝ එම තොරතුරු ආපසු ලබා ගන්නා අවස්ථාවකදී; හෝ

17.6.3 යම් මූල්‍ය අපරාධයක් සිදුවීමේ සම්භාවිතාව පිළිබඳව **කාගිල්ස් බැංකුවට** සැකයක් පවතින අවස්ථාවකදී හෝ යම් ගණුදෙනුකරුවකු විසින් **කාගිල්ස් බැංකුවේ** සාමාජිකයකු වෙත සිදුවියහැකි මූල්‍ය අපරාධයක් පිළිබඳව කරුණු ඉදිරිපත් කරනු ලබන අවස්ථාවකදී;

**කාගිල්ස් බැංකුව විසින්** :-

(අ) ගණුදෙනුකරු වෙත අලුත් සේවා සැපයීමට හෝ ගණුදෙනුකරු වෙත සපයනු ලබන සේවා සියල්ල හෝ එහි යම් කොටසක් පවත්වාගෙන යෑම සිදු කරනු නොලැබිය හැකි අතර ගණුදෙනුකරු සමග පවතින ස්වකීය ව්‍යාපාරික සම්බන්ධතාවයන් අවසන් කිරීමේ අයිතියද බැංකුව විසින් තබාගනු ලැබේ.

(ආ) අනුකූලව ක්‍රියා කිරීමේ වගකීම් සපුරාලීම සඳහා **කාගිල්ස් බැංකුවට** අවශ්‍ය විය හැකි යම් පියවර ගනු ලැබිය හැකිය; සහ/හෝ

(ඇ) ගණුදෙනුකරුගේ ගිණුම (ගිණුම්) අවහිරකිරීම, පැවරීම් හෝ වසා දැමීම කරනු ලැබිය හැකිය.

## 18. දත්ත ආරක්ෂාව

18.1 දත්ත ආරක්ෂා කිරීමේ නීතිය ප්‍රකාරව දේශීය කලාපයකදී හෝ දේශාන්තරවලදී දත්ත සකස් කරනු ලැබූවද, **කාගිල්ස් බැංකුවේ** සියලුම සාමාජිකයන්, කාර්ය මණ්ඩලය සහ තුන්වන පාර්ශව යටත් වන්නාවූ රහස්‍යභාවය සහ ආරක්ෂාව පිළිබඳ දැඩි නීති සංග්‍රහයක් මගින් ගණුදෙනුකාර තොරතුරු ආරක්ෂා කරනු ලැබේ.

## 19. මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම්.

19.1 මූල්‍ය අපරාධ අනාවරණය කරගැනීම, විමර්ශනය සහ වැළැක්වීමට අදාළ (මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම්) හෝ ඒහා සම්බන්ධ නීති සමග,

නියෝග, සම්බාධක, පැනවීම්, ජාත්‍යන්තර මාර්ගෝපදේශ, අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි සහ/හෝ යම් අධිකාරියකින් ලැබෙන ඉල්ලීම් සමග (බැංකුවේ පරම සහ ඒකායන අභිමතය පරිදි) **කාගිල්ස් බැංකුව** විසින් අනුකූලව ක්‍රියා කිරීමට නියමිත සහ ඒ සමග අනුකූලව ක්‍රියා කිරීම සඳහා උචිත බවට සලකනු ලබන යම් පියවර බැංකුව විසින් ගනු ලැබිය හැකිය. එම පියවර සඳහා පහත සඳහන් කරුණුවලට සීමා නොවන්නාවූ පහත සඳහන් පියවර ඇතුළත් වේ; එනම් (අ) යම් උපදෙස්, සන්නිවේදන, කොටස් ගෙවීම් ඉල්ලීමක්, සේවා ඉල්ලීමක් හෝ ගණුදෙනුකරුවෙත යවන ලද ගණුදෙනුකරු විසින් යවන ලද හෝ ගණුදෙනුකරු වෙනුවෙන්වූ යම් ගෙවීමක් පරික්ෂා කිරීම, රඳවාගැනීම සහ පරීක්ෂාකර බැලීම; (ආ) අරමුදල් ලැබීමේ මූලාශ්‍රය හෝ අරමුදල්වල අපේක්ෂිත ප්‍රතිග්‍රාහකයන් විමර්ශනය කිරීම; (ඇ) **කාගිල්ස් බැංකුව** සන්තකයේ පවතින වෙනත් ආශ්‍රිත තොරතුරු සමග ගණුදෙනුකාර තොරතුරු ඒකාබද්ධ කිරීම; සහ/හෝ යම් තැනැත්තකුගේ හෝ අස්ථිත්වයක තත්ත්වය පිළිබඳ තවදුරටත්වූ විමර්ශන සිදුකිරීම, ඔවුන් සම්බාධක සමූහයකට යටත්වේද යන්න හෝ ගණුදෙනුකරුගේ අනන්‍යතාවය සහ තත්ත්වය තහවුරු කරමින් තවදුරටත්වූ විමර්ශනය සිදුකිරීම.

19.2 විශේෂයෙන්ම, **කාගිල්ස් බැංකුව** විසින් මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරන ක්‍රියාකාරකම් භාරගැනීම මගින් කාගිල්ස් බැංකුවට යම් මුදල් ගෙවීමේ හෝ ගෙවීම් කටයුතු නිෂ්කාශනය කිරීමේ, ගණුදෙනුකාර උපදෙස් සැකසීමේ හෝ සේවා සඳහා ඉල්ලුම්කිරීම් සකස්කිරීමේ හෝ සේවා සියල්ල හෝ ඉන් යම් කොටසක් සැපයීමේ යම් ප්‍රමාදයක්, අවහිරවීමක්, හෝ ප්‍රතික්ෂේප කිරීමක් සිදුවීමට හේතු විය හැකිය.

නීතිය මගින් අවසර ලබාදී ඇති සීමාව දක්වා, මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් භාරගැනීම සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් සිදුවූ ගණුදෙනුකරු විසින් හෝ යම් තුන්වන පාර්ශ්වයක් විසින් විඳින ලද හෝ දරන ලද ඕනෑම ආකාරයකින් උපචිතවූ පාඩු සම්බන්ධයෙන් **කාගිල්ස් බැංකුව** ගණුදෙනුකරුට හෝ යම් තුන්වන පාර්ශ්වයක් වෙත වගකියනු නොලැබේ.

## 20. බැංකුවේ උසස් කිරීමේ සහ හිලව් කිරීමේ අයිතිය.

බැංකුවේ සාමාන්‍ය උසස් කිරීමේ, හිලව් කිරීමේ හෝ යම් ගිණුමක් සම්බන්ධයෙන්

බැංකුව සතුවන ඇපකර මාර්ගයෙන්වූ වෙනත් අයිතිවාසිකම්වලට අගති විරහිතව සහ ඒවාට අතිරේකව, බැංකුව විසින් ඕනෑම අවස්ථාවකදී පූර්ව නිවේදනයකින් තොරවඃ-

(අ) යම් සැබෑ, අවිනිශ්චිත, වර්තමාන හෝ අනාගත යන ගිණුම්හිමියා විසින් පරම වශයෙන් හෝ වෙනත් යම් තැනැත්තකු සමග හවුලේ අයිතිය දරනු ලබන ("ණයගැතිභාවය") ඕනෑම ආකාරයක ණයගැතිභාවයකට එරෙහිව ගිණුම්හිමියාගේ ගිණුමේ බැරට හෝ ගිණුම්හිමියාගේ නමින් පරම වශයෙන් පවතින හෝ වෙනත් යම් තැනැත්තකු සමග හවුලේ පවතින ගිණුම්හිමියාගේ නමින්වූ වෙනත් යම් ගිණුමක බැරට පවතින ඕනෑම ව්‍යවහාර මුදලකින්වූ ("එකී මුදල්") යම් මුදල් (එම අදාළකර ගැනීම මගින් කල්පිරීමේ දිනයට පෙරාතුව යම් තැන්පතුවක් අක්‍රියවීමක් සිදුවුවද) අදාල කරගනු ලැබිය හැකි බවට සහ/ හෝ;

(ආ) ගිණුම්හිමියා විසින් ඉල්ලා සිටීමේදී හෝ ගිණුම්හිමියා වෙත යම් මුදල් අයවීමට පැවතියදී යම් මුදලක් ගිණුම්හිමියා වෙත ගෙවීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි බවට හෝ එම අවස්ථාවේ පවතින ණයගැතිභාවය එම අවස්ථාවේ ගිණුමේ පවතින මුදල් ප්‍රමාණයට සමානවන හෝ එම මුදල් ප්‍රමාණය ඉක්මවායන තාක්දුරට ගිණුම්හිමියා වෙත මුදල් ආපසු ගෙවීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි බවට;

ගිණුම්හිමියා විසින් එකගව සිටිනු ලැබේ. ඉහත 15 වන වගන්තිය යටතේවූ බැංකුවේ අයිතිවාසිකම් සඳහා ගණුදෙනුකරුගේ මියයෑම හෝ නෛතික නුසුදුසුකම බල නොපෑ යුතුය.

## 21. ක්‍රියාත්මක නොවන ගිණුම් - අක්‍රිය බව හා අත්හැර දමන ලද දේපල.

යම් ගිණුමක් ක්‍රියාත්මක නොවන අවස්ථාවකදී, සහ අක්‍රීයබවට පත්වන අවස්ථාවකදී, ගණුදෙනුකරු/ ගණුදෙනුකරුවන් විසින් ගිණුම ක්‍රියාත්මක කිරීම සඳහාවූ ඉල්ලීමක්ද සමග ස්වකීය වර්තමාන විස්තර (පුද්ගලික විස්තර, සම්බන්ධවීමේ දුරකථන අංක විස්තර, සේවා නියුක්තිය පිළිබඳ සහ මූල්‍ය විස්තර) සහ ජාතික හැඳුනුම්පත් පිටපතක් සැපයීමට අවශ්‍ය වේ.

අත්හැර දමන ලද දේපල සඳහා බැංකු පහසුකමක් සඳහාවූ ඇපකරයක් වශයෙන්

හැර (ආරක්ෂක තැන්පතු සේප්පුවක (SDL) පවතින ද්‍රව්‍ය වැනි දේ), ගණුදෙනුකරු විසින් හෝ ගණුදෙනුකරුවකු වෙනුවෙන් යම් බැංකු ගිණුමක පවතින ශේෂයක් (ජංගම, ඉතුරුම්, වාර තැන්පතු හෝ අන්‍යාකාර) සහ වෙනත් යම් දේපලක් මෙන්ම අවුරුදු දහයකට වඩා වැඩි කාලසීමාවක් සඳහා කිසිදු ගණුදෙනුවක් සිදුකර නොමැති යම් බැංකු ගිණුමක් හෝ දේපලක් ඇතුළත් වේ.

සෑම වර්ෂයක් අවසන්වීමෙන් මාස හයක කාලසීමාවක් ඇතුළත වාර්ෂික පදනමක් මත මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් අත්හරින ලද දේපළ සම්බන්ධයෙන් යම් ආකෘතියකින් ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) වෙත බැංකුව විසින් වාර්තාවක් ඉදිරිපත් කිරීමට නියමිත වේ.

CBSL වෙත වාර්තාව භාරදීමේ දින සිට දින තිහක (30) කාල සීමාවක් ඇතුළත, අදාළ දේපළෙහි අයිතිකරුගේ නම සහ ඒ පිළිබඳ වෙනත් විස්තර සඳහන් කරමින් බැංකුව විසින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පුවත්පත්වල එකී අත්හැර දමන ලද දේපළ පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක් පළකරනු ලැබිය යුතුය.

එයට සමගාමීව, අත්හරිනලද දේපලවල අයිතිකරුවන් වෙත එම දේපළ පිළිබඳව දැනුම් දෙමින් සහ එම දේපල සඳහා හිමිකම් ඉදිරිපත් කිරීම පිණිස ඔවුන්ට සාධාරණ කාලයක් ලබාදෙමින් එම අත්හැර දමන ලද දේපලවල පිළිවෙලින්වූ අයිතිකරුවන්ගේ අවසාන වශයෙන් දැනුම්දී ඇති ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් බැංකුව විසින් නිවේදන යවනු ලැබිය යුතුය.

ගණුදෙනුකරු විසින් වලංගු හිමිකම්පෑමක් ඉදිරිපත්කර ඇත්නම් මිස, බැංකුව විසින් සාධාරණ බවට තීරණය කරනු ලබන යම් කාලසීමාවක් ඇතුළත බැංකුව විසින්:-

(i) සියලු ව්‍යවහාර මුදල්වලින් එම අක්‍රීය ගිණුමේ පවත්වාගෙන යනු ලැබූ අරමුදල් CBSL වෙත පවරනු ලැබිය යුතුය;

(ii) බැංකුව විසින් ආරක්ෂිත තැන්පතු සේප්පුව කඩා විවෘතකර එහි අඩංගු ද්‍රව්‍ය ඉවතට ගනු ලැබිය යුතුය.

අනන්‍යතාවය පිළිබඳ තහවුරු කිරීමෙන් පසුව, එසේ CBSL වෙත පවරන ලද

අරමුදල් සඳහා හිමිකම්පෑමට ගණුදෙනුකරුවන්ට ඕනෑම අවස්ථාවකදී හිමිකමක් තිබිය යුතුය.

වලංගු හිමිකම්පෑමක් ඉදිරිපත් කරනු ලබන තෙක් ආරක්ෂිත තැන්පතු සේප්පුවල පවතින ද්‍රව්‍ය හානි කිරීමකින් තොරව බැංකුවේ සුරක්ෂිත සන්තකයේ රඳවා තබා ගනු ලැබිය යුතුය.

එම අත්හැර දමන ලද දේපල සඳහා හිමිකම්පානු ලබන ගණුදෙනුකරුගේ උරුමකරුවන් සහ අනුප්‍රාප්තිකයන් විසින්, නීතිය මගින් නියම කර ඇති ආකාරයට ඔවුන්ගේ හිමිකම්පෑම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලිපිලේඛන බැංකුව වෙත ඉදිරිපත් කිරීමට නියමිත වේ.

ඉහතකී කාර්යපටිපාටිය සම්බන්ධයෙන් බැංකු විසින් දරන ලද පිරිවැය බැංකුව විසින් එම අත්හැර දමන ලද දේපළෙහි අයිතිකරුවන්ගෙන් අයකර ගනු ලැබිය යුතුය.

## 22. විවිධ විධිවිධාන.

ගණුදෙනුකරු සහ **කාගිල්ස් බැංකුව** අතර පවතින මෙම නියම හා කොන්දේසි සහ වෙනත් යම් සේවා, නිෂ්පාදන, ව්‍යාපාරික සම්බන්ධතා, ගිණුම් හෝ ගිවිසුම් අතර යම් ගැටුම් සහගත තත්වයක් හෝ අනනුකූලතාවක් පවතින අවස්ථාවකදී, මෙම නියම හා කොන්දේසි බලාත්මක වන්නේය. ගණුදෙනුකරුගේ තොරතුරු සම්බන්ධයෙන් දැනටමත් පවතින ගණුදෙනුකරුගේ කැමැත්ත ලබා දීම්, බලය පැවරීම්, **කාගිල්ස් බැංකුව** විසින් ඉල්ලා සිටින ලද අත් හැරීම් සහ අවසර ලබාදීම් අදාළ දේශීය නීතිය මගින් අවසරදී ඇති ප්‍රමාණය දක්වා සම්පූර්ණ බලයෙන් සහ බලාත්මක ස්වභාවයෙන් අඛණ්ඩව අදාළ විය යුතුය.

22.2 මෙම නියම හා කොන්දේසිවල අඩංගු සියලු හෝ යම් විධිවිධාන යම් බල ප්‍රදේශයක පවතින නීතිය යටතේ ඕනෑම ආකාරයකින් නීති විරෝධී, අවලංගු හෝ බලාත්මක කළ නොහැකි වන්නේ නම්, එය වෙනත් යම් බල ප්‍රදේශයකදී එකී විධිවිධානවල නීත්‍යානුකූලභාවය, වලංගුභාවය හෝ බලාත්මකකළ හැකි බව සඳහා බලනොපෑයුතු හෝ එහි බලය හීන වීමක් එමගින් සිදු නොවිය යුතු හෝ එම බල ප්‍රදේශයේදී මෙම නියම හා කොන්දේසිවල ඉතිරි කොටස සඳහා බලනොපෑ යුතු හෝ එහි බලය හීන වීමක් එමගින් සිදු නොවිය යුතුය.

## 23. ගිවිසුම අවසන් කිරීමේදී ඉතිරිවන විධිවිධාන.

23.1 මෙම නියම සහ කොන්දේසි අවසන් කිරීම, **කාගිල්ස් බැංකුව** විසින් ගණුදෙනුකරු වෙත සපයනු ලබන යම් සේවා අවසන් කිරීම හෝ යම් ගණුදෙනුකාර ගිනුමක් වසා දැමීම පිළිබඳ නොසලකා හරිමින්, මෙම නියම හා කොන්දේසි අඛණ්ඩව අදාළ වන්නේය.

## 24. නියම සංශෝධනය කිරීම.

24.1 මෙම නියම හා කොන්දේසි රටෙහි බලාත්මකව පවතින නීතිය ප්‍රකාරව පාලනයවන මෙන්ම ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු අතර මෙම නියම හා කොන්දේසිවල යම් සංශෝධනයක් නීතිය මගින්, රජයේ නියෝග මගින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හෝ වෙනත් යම් ව්‍යවස්ථාපිත ආයතනයක් විසින් නිකුත් කරනු ලබන උපදෙස් මගින් සිදු කිරීමට අවශ්‍යවේනම් හෝ බැංකුව විසින් සංශෝධනය කිරීමට අවශ්‍ය වේ නම්, එවිට මෙම නියම හා කොන්දේසි ස්වයංක්‍රීයව සංශෝධනය වීමට යටත් වන්නේය.

24.2 මෙහි අන්තර්ගත සියලුම නියම හා කොන්දේසි මගින් සහ එහි යම් පශ්චාත් සංශෝධන මගින් ගිණුම්හිමියා/ගිණුම්හිමියන් පරම වශයෙන් සහ සමාන ලෙස බැඳී සිටින්නේය.

24.3 බැංකුව විසින් ස්වකීය පරම අභිමතය පරිදි යෝග්‍ය බවට තීරණය කරනු ලබන ආකාරයට සහ පූර්ව නිවේදනයක් කිරීමෙන් තොරව මෙහි සඳහන් නියම හා කොන්දේසි සඳහා කලින් කල අලුතින් එකතු කිරීම් සිදු කිරීම සඳහා, එම නියම හා කොන්දේසි ප්‍රතිශෝධනය කිරීම, සංශෝධනය කිරීම, ඉවත් කිරීම, අවලංගු කිරීම හෝ වෙනස් කිරීම සඳහා බැංකුව විසින් අයිතිය තබාගනු ලැබේ. බැංකුවේ මෙම නියම හා කොන්දේසි සහ එහි යම් සංශෝධන බැංකුවේ නිල වෙබ් අඩවියවන www.cargillsbank.com දරන වෙබ් අඩවියෙන් සහ/හෝ ඉල්ලීමක් කිරීමේදී ඕනෑම බැංකු ශාඛා කාර්යාලයකින් සහ/හෝ ප්‍රකාශන පණිවුඩ හරහා ගිණුම්හිමියා/ගිණුම්හිමියන් විසින් ලබාගත හැකි අතර එම ක්‍රම හරහා ලබා ගැනීම මගින් ගිණුම්හිමියා/ගිණුම්හිමියන් වෙත එම නියම හා කොන්දේසි පිළිබඳ නිවේදන ලබාදී ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

24.4 ගිණුමක් ආරම්භකර පවත්වාගෙන යනු ලබන යම් තැනැත්තකු අවස්ථාවෝචිත පරිදි මෙම නියම හා කොන්දේසි හෝ වෙනත් යම් අදාල නියම හා කොන්දේසි කියවා තේරුම් ගෙන, ඒවා මගින් බැඳී සිටිනු ලබන බවට සලකනු ලැබිය යුතුය. එවැනි ගිණුමක්/ ගිණුම් විවෘත කිරීම සඳහාවූ ඉල්ලුම්පත්‍රය මත තත්කාර්ය සඳහා වූ ප්‍රකාශයක් සම්පූර්ණ කරනු ලැබිය යුතුය.

## 25.0 නියමයන්හි පරිවර්තනය.

25.1 මෙම නියම හා කොන්දේසි සිංහල සහ දෙමළ භාෂාවලින්ද පවතින්නේය. ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් පැවතියහොත් එවිට ඉංග්‍රීසි භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

25.2 මෙම නියම හා කොන්දේසිවල සිංහල සහ දෙමළ භාෂා පරිවර්තනයන් බැංකුවේ වෙබ් අඩවියෙහි (www.cargillsbank.com) සහ මුද්‍රිත ස්වරූපයෙන් බැංකුවේ සියලුම ශාඛාවල පවතියි.

## 26. පාලනයෙන් පරිබාහිර අදිසි තත්ත්වය.

පාලනයෙන් පරිබාහිර අදිසි තත්වය අවසන්වනතෙක් අප විසින් සේවා සැපයීම අත්හිටුවනු ලැබේ.

''පාලනයෙන් පරිබාහිර අදිසි තත්ත්වය" යන්නෙන්-

(අ) ගංවතුර, කුණාටු, භූමිකම්පා හෝ වෙනත් ස්වාභාවික සිදුවීම්;

(ආ) යුද්ධ, එදිරිවාදිකම්, ත්‍රස්තවාදය, විප්ලව, කැරලි හෝ සිවිල් කලබල;

(ඇ) වැඩ වර්ජන, සේව්‍යයා විසින් සේවකයන් පිටමන්කර තැබීම්, හෝ වෙනත් කාර්මික පියවර; හෝ

(ඈ) නීතිය වෙනස්වීම හෝ යම් නීතියක අර්ථනිරූපණය හෝ

බලාත්මකභාවය වෙනස් වීම,

අදහස් වේ.

ඔබට සේවය සපයනු ලබන ආකාරය පිළිබඳව ඔබ කිසිසේත් සෑහීමට පත් නොවන්නේ නම් හෝ අපගේ සේවා මඟින් ඔබගේ අපේක්ෂාවන් සපුරාලනු නොලබයි නම් කරුණාකර පහත සඳහන් විකල්ප ක්‍රමවලින් එකක් භාවිතා කරමින් වහාම අප හා සම්බන්ධ වන්න:-

- ❖ පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම්වන +94117640000 හරහා අප හා සම්බන්ධවන්න.

- ❖ ඔබගේ ගැටලුව customersupport@cargillsbank.com යන විද්‍යුත් ලිපිනය වෙත විද්‍යුත් තැපෑලෙන් යොමු කරන්න.

- ❖ අපට ලියන්නඃ- ගණුදෙනුකාර විමසීම් ඒකක ප්‍රධානී, කාගිල්ස් බැන්ක් ලිමිටඩ්, අංක 696, ගාලුපාර කොළඹ 3.

- ❖ අප වෙත යොමු කරන ලද ඔබගේ ගැටළු ඔබ සම්පූර්ණයෙන්ම සෑහීමට පත්වන ආකාරයට විසඳීම සඳහා අප විසින් කැමැත්තෙන් පසුවන අතර ඔබ විසින් ඔබගේ ගැටලුව මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය වෙතද ලිඛිතව ඉදිරිපත්කර සහන ඉල්ලා සිටිය හැකිය. ඔම්බුඩ්ස්මන්වරයාගේ සම්බන්ධවීමේ තොරතුරු වනුයේඃ- මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය, අංක 143A, වජිර පාර, කොළඹ 05, ශ්‍රී ලංකාව. දුරකථන අංකය +94112 595 625 ෆැක්ස් අංකය +94112 595 624 විද්‍යුත් ලිපිනය:- info@financialombudsman.lk වෙබ් අඩවිය:- www.financialombudsman.lk

- ❖ වැඩිපුර විස්තර සඳහා කරුණාකර අපගේ www.cargillsbank.com යන වෙබ් අඩවියට පිවිසෙන්න.